කාර්යසාධන වාර්තාව - 2014

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

පටුන

		පිටු අංකය
1.	දැක්ම, මෙහෙවර, දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා සංවිධාන සැලැස්ම	2-4
2.	2014 වර්ෂයේ කාර්යය සාධනය	
2.1	සමාලෝචනය	5
2.2	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම	5-8
2.3	ක්ෂුද්‍රමූල්‍යනය	8-11
2.4	කෘෂිකාර්මික ක්ෂේත්‍රය නඟා සිටුවීම	11-18
2.5	ආහාර සුරක්ෂිතතාව	18-22
2.6	නියං සහන	22-24
2.7	විශේෂ ණය යෝජනා ක්‍රම	24-26
3.	ආයතනික හා පරිපාලන කටයුතු	
3.1	කාර්යය මණ්ඩලය	27
3.2	කාර්යය මණ්ඩල තොරතුරු	28
3.3	දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ	29-30
3.4	විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ	31
4.	මූල්‍ය තොරතුරු	32

දැක්ම

" සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්, (ක්ෂුද්‍ර ව්‍යාවසායයන්,
බැංකු අංශය සහ මූල්‍ය වෙළෙඳපොලවල් ද ඇතුළුව) නගා සිටුවීම සඳහා
අවශ්‍ය පහසුකම් සැලසීමේ රජයේ ප්‍රධාන නියෝජිතයා ලෙස
කටයුතු කරමින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම."

මෙහෙවර

" සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය අංශය, ක්ෂුද්‍ර ව්‍යවසායය
අංශය හා බැංකු අංශය සංවර්ධනය කිරීම වෙනුවෙන්
අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා
ක්‍රමෝපායන් සැකසීම හා අදාල කොටස්කරුවන්ගේ
මැදිහත්වීම තුළින් මූල්‍ය වෙළෙඳපොල වර්ධනය කිරීම."

දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- මූල්‍ය අංශය සංවර්ධනය කිරීම සහ රාජ්‍ය අනුග්‍රහය ලත් මූල්‍ය අනුග්‍රාහක යෝජනාවලීන් සඳහා සුදුසු ප්‍රතිපත්ති වැඩසටහන් සහ උපායමාර්ග සම්පාදනය කිරීම.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශවලට අදාල මූලික ගැටළු හඳුනාගැනීම සහ ඒ සඳහා විසඳුම් ලබාදීම.

- බැංකුකරණය, රක්ෂණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායය සහ ක්ෂුද්‍ර ව්‍යාවසායය සඳහා වන නීති සම්පාදනය සඳහා පහසුකම් සැපයීම.

- අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම, ඒ සඳහා අවශ්‍ය පසුවිපරම්/අධීක්ෂණ කටයුතු සිදු කිරීම සහ එම යෝජනා සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය වන පහසුකම් සැපයීම.

- කාලීන වශයෙන් දේශීය ආර්ථිකය තුළ ඇති වන ගැටළු විසඳීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

සංවිධාන සටහන



නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ගණ. - ගණකාධිකාරි
ස.අ. - සහකාර අධ්‍යක්ෂ
තො.ස.තා.ස. - තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර
ක.ස. - කළමනාකරණ සහකාර
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

අංශ
මූ.වෙ. හා ප්‍රා.අ. - මූල්‍ය වෙළෙඳපොල හා ප්‍රාථමික අංශය
ක්.මූ. හා පරි. - ක්ෂුද්‍රමූල්‍ය අංශය හා පරිපාලන
සු.ම.ප. - සුළු හා මධ්‍ය පරිමාණ අංශය
උ.සැ.ස.මූ. හා ඈ. - සංවර්ධන මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොල

2. 2014 වර්ෂයේ කාර්යය සාධනය

2.1 සමාලෝචනය

රටෙහි සංවර්ධනය උදෙසා සමතුලිත ආර්ථික වර්ධනය, තුලිත ප්‍රාදේශීය සංවර්ධනය, නව රැකියා අවස්ථා උත්පාදනය හා ඵලදායීතාව නංවාලීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායය හා ක්ෂුද්‍රමූල්‍ය අංශයන් මඟින් ලබා දී ඇති දායකත්වය සැලකිල්ලට ගනිමින් එම අංශයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් විවිධ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කර ඇත. සාම්ප්‍රදායික බැංකුකරණයෙන් බැහැරව, අඛණ්ඩව මූල්‍ය සහාය සැපයීමත් සමගම උපදේශනය හා අධීක්ෂණය මෙන්ම අලෙවිකරණය හා නව තාක්ෂණ සේවාවන් ද ලබා දීම තුළින් වාණිජ බැංකු මෙන්ම සංවර්ධන බැංකු ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නිසියාකාරව සිය කාර්යභාරය සිදු කරන්නේ ද යන්න තහවුරු කර ගනිමින් එම කර්මාන්තයන් තවදුරටත් නවීකරණය කිරීම සඳහා සහයෝගය ලබා දෙනු ලැබේ.

ක්ෂුද්‍ර මූල්‍යනය තුළින් ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායය සංවර්ධනය සඳහා ඉඩ ප්‍රස්ථා ලබා දී ඇති අතර, ක්ෂුද්‍ර මූල්‍යනයේ අන්තර්ගත ඇතැම් විශේෂ ගුණාංගයන් හේතුවෙන් ඒ සම්බන්ධයෙන් සුවිශේෂී අවධානය යොමු කළ යුතුවේ. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍රමූල්‍ය අංශය සැළකිය යුතු අන්දමින් පුළුල් වී ඇති අතර, රටෙහි ග්‍රාමීය සංවර්ධනය සඳහා එමඟින් සුවිශේෂී කාර්යභාරයක් සිදු කර ඇත. එසේම, විධිමත් බැංකුකරණය සඳහා ඍජු ප්‍රවේශ මාර්ග නොමැති අවිධිමත් අංශයේ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් ඇතුළු අඩු ආදායම්ලාභී නාගරික සමාජ කොට්ඨාශයන්හි මූල්‍යමය අවශ්‍යතා ද සපුරාලීමට කටයුතු කර ඇත.

දළ දේශීය නිෂ්පාදිතයට ප්‍රාදේශීය මට්ටමේ දායකත්වය ඉහළ නැංවීමත්, ප්‍රාදේශීයව පවතින අසමතුලිතතා අවම කිරීමත්, ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීමත් හා රටෙහි ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමේ අරමුණින් රජය විසින් අඛණ්ඩව යෙදවුම් සහනාධාර වශයෙන් පොහොර සහනාධාරය, බීජ හා රෝපණ ද්‍රව්‍ය, සහනදායී පොලී අනුපාත යටතේ වගා ණය හා කෘෂි නිෂ්පාදන සඳහා සහතික මිලක් ලබා දීම සිදු කරනු ලබන අතර එමඟින් කෘෂි අංශය ප්‍රවර්ධනය සිදු කිරීම සඳහා විශාල පිටුවහලක් වී ඇත. මෙයට අමතරව, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය දියත් කිරීම හා වගා රක්ෂණාවරණය පුළුල් කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් ගොවීන්ගේ සමාජ ආරක්ෂණය හා සුභසාධනය නංවාලීම සඳහා රජය කටයුතු කරනු ලැබේ.

2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම

මෙරට ආර්ථික සංවර්ධනයේ කොඳු නාරටිය ලෙස සැලකෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් පුළුල් කරමින් ඔවුන්ට අවශ්‍ය උපදේශන සේවාවන් සපයන මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වීම සඳහා රජය විසින් නිරතුරුවම මූල්‍ය ආයතන උනන්දු කරවනු ලැබේ. 2014 වර්ෂය තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍යමය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා රු. මිලියන 521,385 ක මුදලක් රජයේ හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් ණය වශයෙන් ලබා දී ඇත. සාම්ප්‍රදායික බැංකුකරණ රාමුවෙන් මිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ඔවුන් යෙදී සිටින ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ ඊළඟ ඉහළ තලයට ඔසවා තැබීම සඳහා අවශ්‍ය සහයෝගය හා මඟ පෙන්වීම නිරතුරුවම ලබා දීමට මෙම බැංකු විසින් කටයුතු කරනු ලැබේ.

වගුව 1 - රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ලබා දුන් ණය - 2014

බැංකුව	කෘෂිකාර්මික		කර්මාන්ත		සේවා		වෙනත්		එකතුව	
	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	ණය මුදල (රු. මිලියන)
ලංකා බැංකුව	2,667	6,391	1,465	2,993	228	438	16,730	26,490	21,090	36,312
මහජන බැංකුව	308	641	1,119	3,576	169	539	2	2	1,598	4,757
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	834	552	1,015	773	1,120	859	613	421	3,582	2,605

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව	73	128	93	367	3	3	10	30	179	528
සණස සංවර්ධන බැංකුව	652	319	139	206	73	112	401	282	1,265	919
ජාතික සංවර්ධන බැංකුව	889	2,220	2,556	8,452	194	1,121	494	1,486	4,133	13,278
ඞී.එෆ්.සී.සී. බැංකුව	400	2,235	1,161	6,806	1,106	8,056	2,318	11,937	4,985	29,034
කොමර්ෂල් බැංකුව	4,753	15,071	6,929	30,645	25,703	151,679	10,041	22,851	47,426	220,246
සම්පත් බැංකුව	5,420	9,184	7,255	13,590	7,374	19,992	28,304	34,767	48,353	77,533
සෙලාන් බැංකුව	1,617	5,931	4,443	16,809	6,063	13,037	3,507	9,543	15,631	45,320
හැටන් නැෂනල් බැංකුව	4,054	6,981	2,417	11,562	6,439	26,401	1,150	2,472	14,060	47,415
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	275	2,015	673	2,221	2,240	8,594	9,445	15,011	12,633	27,840
යුනියන් බැංකුව	2,848	1,409	1,170	2,283	1,028	1,783	28,829	10,123	33,875	15,599
එකතුව	**24,790**	**53,075**	**30,435**	**100,281**	**51,740**	**232,614**	**101,844**	**135,414**	**208,810**	**521,385**

මූලාශ්‍රය : අදාළ වාණිජ හා සංවර්ධන බැංකු

2014 වර්ෂය තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වාණිජ හා සංවර්ධන බැංකු විසින් ප්‍රදානය කරන ලද සමස්ත ණය සංඛ්‍යාවෙන් සියයට 12 ක් කෘෂිකාර්මික අංශයටත්, සියයට 14 ක් කාර්මික අංශයටත්, සියයට 25 ක් සේවා අංශයටත් හා ඉතිරි සියයට 49 අනෙකුත් අංශවලටත් ලබා දී ඇත.

රූප සටහන 1 - අංශික වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ණය ප්‍රදානය කිරීම - 2014



2.2.1 සුළු හා මධ්‍ය පරිමාණ අංශය සංවර්ධනය සඳහා විදේශ මූල්‍ය ආධාර සපයන ව්‍යාපෘති

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් නඟා සිටුවීම සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑමකට ලක් වූ ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමයි. මෙම ව්‍යාපෘතිය, මූල්‍ය හා අවදානම් අවම කිරීමේ පහසුකම් (ඇ.ඩො. මිලියන 504) සහ සුළු හා මධ්‍ය පරිමාණ බැංකු කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති හා ධාරිතා සංවර්ධනය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වේ (ඇ.ඩො. මිලියන 7). 2011 වසරේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2013 අගෝස්තු 2 වන දින

ප්‍රතිව්‍යුහගත කරන ලදී. 2014 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් රු. මිලියන 5,898 ක් වටිනා ව්‍යාපෘති 743 ක් සඳහා ණය අනුමත කර ඇති අතර සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් එම අනුමත ණය සංඛ්‍යාවෙන් ව්‍යාපෘති 585 ක් සඳහා රු. මිලියන 4,256 ක් ලබා දී ඇත. එය අනුමත වු ණය මුදලින් සියයට 72 ක් වන අතර සමස්ත ණය යෝජනා ක්‍රමයෙන් සියයට 70 කි.

වගුව 2 - 2014.12.31 දිනට ව්‍යාපෘතියේ ප්‍රගතිය

සහභාගීත්ව මූල්‍ය ආයතනය	අනුමත ණය		ලබා දී ඇති ණය		ලබා දීමට නියමිත ණය		
	සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)	සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)	සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)	ඇ.ඩො. මිලියන
ලංකා බැංකුව	135	1,001.01	95	579.07	62	421.94	3.22
කොමර්ෂල් බැංකුව	85	598.20	83	552.20	3	46.00	0.35
ඩී.එෆ්.සී.සී. බැංකුව	27	368.05	26	363.70	1	4.35	0.03
හැටන් නැෂනල් බැංකුව	55	783.28	44	559.64	26	223.64	1.71
ජාතික සංවර්ධන බැංකුව	32	503.93	31	482.43	2	21.50	0.16
මහජන බැංකුව	133	973.99	99	545.97	53	428.02	3.27
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	183	743.75	120	386.58	74	357.17	2.73
සම්පත් බැංකුව	93	929.90	87	786.09	17	143.81	1.10
එකතුව	**743**	**5,902.10**	**585**	**4,255.67**	**238**	**1,646.43**	**12.56**

මූලාශ්‍රය : අදාළ වාණිජ හා සංවර්ධන බැංකු

2014 වසර තුළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වැඩිම ණය ප්‍රමාණයක් ලබා දී ඇති අතර අඩුම ණය ප්‍රමාණය කොමර්ෂල් බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව විසින් ලබා දී ඇත. 2014 දෙසැම්බර් මස 31 දින වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය අනුව වැඩිම ණය මුදල් ප්‍රමාණය වන රු. මිලියන 786 සම්පත් බැංකුව විසින් ලබා දී ඇති අතර අඩුම ණය මුදල් ප්‍රමාණය වන රු. මිලියන 364 ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් ලබා දී ඇත. භූගෝලීය පදනම අනුව 2014 වසර තුළ වැඩිම ණය මුදල් ප්‍රමාණයක් එනම් රු. මිලියන 818 ක් කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා ලබා දී ඇති අතර ඊට අමතරව ගම්පහ දිස්ත්‍රික්කයට රු. මිලියන 572 ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයට රු. මිලියන 465 ක් ද, කළුතර දිස්ත්‍රික්කයට රු. මිලියන 303 ක් ද, ගාල්ල දිස්ත්‍රික්කයට රු. මිලියන 296 ක් ද, මාතර දිස්ත්‍රික්කයට රු. මිලියන 240 ක් ද, පුත්තලම දිස්ත්‍රික්කයට රු. මිලියන 227 ක් ද සහ මහනුවර දිස්ත්‍රික්කයට රු. මිලියන 221 ක් ද ලෙස පිළිවෙලින් ණය ලබා දී ඇත.

වගුව 3 - සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ලබා දුන් ණය ප්‍රමාණය

බැංකුව	2014 වර්ෂය තුළ ලබා දුන් ණය		2014.12.31 දිනට ලබා දුන් මුළු ණය එකතුව		
	සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)	සංඛ්‍යාව	වටිනාකම (රු. මිලියන)	ඇ.ඩො. මිලියන
ලංකා බැංකුව	40	140.04	95	579.07	4.42
කොමර්ෂල් බැංකුව	5	48.00	83	552.20	4.21
ඩී.එෆ්.සී.සී. බැංකුව	-	-	26	363.70	2.78
හැටන් නැෂනල් බැංකුව	26	237.41	44	559.64	4.27
ජාතික සංවර්ධන බැංකුව	12	147.00	31	482.43	3.68
මහජන බැංකුව	44	222.73	99	545.97	4.17

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	46	141.12	120	386.58	2.95
සම්පත් බැංකුව	38	367.39	87	786.09	6.00
එකතුව	**211**	**1,303.70**	**585**	**4,255.67**	**32.47**

මූලාශ්‍රය : අදාළ වාණිජ හා සංවර්ධන බැංකු

2014 දෙසැම්බර් 31 දින වන විට හඳුනාගත් උප ව්‍යවසායය අංශ 23 ක් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දී ඇත. වැඩිම ණය ප්‍රමාණය වන රු. මිලියන 934 හෝටල්, ආපන ශාලා හා සංචාරක ක්ෂේත්‍රයන් සඳහා ලබා දී ඇති අතර දෙවැනි වැඩිම ණය ප්‍රමාණය වන රු. මිලියන 855 කෘෂි සැකසුම් අංශයට ලබා දෙන ලදී. ප්‍රතිමූල්‍ය පහසුකම් ලැබීමේ දී නිපැයුම්, සේවා, ඇඟළුම්, කෘෂිකාර්මික හා ඉදි කිරීම් යන අංශයන්ගේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද අනෙකුත් අංශයන්හි එවැනි වර්ධනයක් පෙන්නුම් නොකරයි.

අපනයන ප්‍රවර්ධනය කිරීම හා හරිත බලශක්තිය

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මූල්‍යකරණය හා පුනර්ජනනීය බලශක්ති කාර්යක්ෂමතාව තුළින් පුද්ගලික අංශයේ දියුණුවට දායක වන ආයෝජන දිරි ගැන්වීමේ අරමුණින් යුරෝ මිලියන 90 ක (ආසන්න වශයෙන් රු. මිලියන 16,200 ක්) පමණ ණය මුදලක් සහනදායී කොන්දේසි යටතේ ලබා දෙන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 නොවැම්බර් මස ශ්‍රී ලංකා රජය හා යුරෝපා ආයෝජන බැංකුව අතර මූල්‍ය ගිවිසුම් අත්සන් කරන ලදී. ආර්ථික වර්ධනය වේගවත් කිරීම හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ අරමුණින් පුනර්ජනනීය බලශක්ති හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ දැමීම යන අංශ සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන අතර සමස්ත ණය මුදලින් සියයට 70 ක් එනම් යුරෝ මිලියන 63 ක් හා සියයට 30 ක් එනම් යුරෝ මිලියන 27 ක් පුනර්ජනනීය බලශක්ති හා බලශක්ති කාර්යක්ෂමතා යන අංශ සඳහා අනුපිළිවෙළින් වෙන් කරන ලදී.

මෙම ණය යෝජනා ක්‍රමය සහභාගීත්ව මූල්‍ය ආයතන තුනක් එනම් කොමර්ෂල් බැංකුව, ඩී.එෆ්.සී.සී. බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් ක්‍රියාත්මක කෙරේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලැබීම සඳහා අවම වශයෙන් යුරෝ 100,000 ක් හෝ උපරිම වශයෙන් යුරෝ මිලියන 25 ක ආයෝජනයක් කළ යුතුය.

මෙමඟින් පුනර්ජනනීය බලශක්තීන් වන සුළඟ, හිරු එළිය, ජල ප්‍රභවය, ජීව බලය හා තාප බලය භාවිතා කිරීමට අයෝජකයින් දිරිමත් කෙරෙන බැවින් මෙම ණය යෝජනා ක්‍රමය තුළින් ශ්‍රී ලංකාවට මූල්‍ය ප්‍රතිලාභයන්ට අමතරව පාරිසරික ප්‍රතිලාභයන් ද හිමි වේ. එපමණක් ද නොව පවත්නා බලශක්තිය කාර්යක්ෂමව උපයෝජනය කිරීමට ද අයෝජකයින් දිරිමත් කෙරේ. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ අංශය සංවර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අළුතින් ආරම්භ කිරීමටත්, පවත්නා පහසුකම් තවදුරටත් දියුණු කිරීමටත් සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල පවතින පහසුකම් පුනරුත්ථාපනය හෝ නවීකරණය කිරීමටත් ණය පහසුකම් ලබා දෙනු ලැබේ. 2014 වර්ෂයේ අවසන් වන විට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 1,324 ක මුදලක් ණය ලාභීන් 30 දෙනෙකු අතර බෙදා දී ඇත.

2.3 ක්ෂුද්‍රමූල්‍යනය

අද වන විට ක්ෂුද්‍රමූල්‍ය කර්මාන්තය තැන්පතු, ණය, ක්ෂුද්‍ර රක්ෂණය හා මූල්‍ය ප්‍රේෂණයන් යන මූලික ක්ෂේත්‍රයන් හතර ආවරණය කෙරෙන "මූල්‍යමය ඒකරාශි වීම" යන නව මානයන් දක්වා වර්ධනය වෙමින් පවතියි. රටේ ක්ෂුද්‍රමූල්‍ය කටයුතු වාණිජ බැංකු, විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය ආයතන හා අවිධිමත් ණය දෙන්නන් යන විවිධ පාර්ශවයන්ගේ දායකත්වයෙන් ක්‍රියාවට නැංවෙන අතර විවිධ සංවර්ධන ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන ද ග්‍රාමීය මට්ටමේ අඩු ආදායම්ලාභී ජනතාවට මූල්‍ය සේවා සඳහා ප්‍රවේශවීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට විශාල සහයෝගයක් ලබා දී ඇත.

ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන අඩු ආදායම්ලාභී ජනතාව දිළිඳු භාවයෙන් මුදවා ගැනීමේ අරමුණින් විවිධ ආයතන හරහා සහනදායි මූල්‍ය පහසුකම් සැපයීමේ දී ප්‍රමුඛ කාර්යභාරයක් රජය විසින් ඉටු කරනු ලබයි. ඒ අනුව 2014 වසර තුළ අඩු ආදායම්ලාභී පවුල් කේන්ද්‍ර කරගත්

ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් රාශියක් රජය හා ඊට අනුබද්ධ ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද අතර එම ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන්වල ප්‍රගතිය පහත දැක්වේ.

වගුව 4 - ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතනවල ප්‍රගතිය - 2014

ක්ෂුද්‍රමූල්‍ය ආයතනය	ශාඛා සංඛ්‍යාව	තැන්පත්කරුවන් සංඛ්‍යාව	ණය හිමියන් සංඛ්‍යාව	මුළු තැන්පතු ප්‍රමාණය (රු. මිලියන)	මුළු ආයෝජන ප්‍රමාණය (රු. මිලියන)	මුළු ණය ප්‍රමාණය (රු. මිලියන)
දිවි නැගුම දෙපාර්තමේන්තුව	1,074	9,104,024	6,618,730	54,479	48,308	128,026
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	2,185	8,743,625	1,454,695	89,634	74,919	37,757
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	532	272,023	483,250	328	2,213	5,826
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	265	5,228,002	466,106	72,544	25,807	25,881
ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව	08	40,244	7,677	354	5,490	2,768
එකතුව	**4,064**	**23,387,918**	**9,030,458**	**217,339**	**156,737**	**200,258**

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

සමස්තයක් ලෙස මෙම ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ණය පහසුකම් හෝ තැන්පතු ලෙස මූල්‍යමය සේවාවන් සපයනු ලබයි. ඒ අනුව ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය රු. බිලියන 200 ද ඉක්මවන අතර ඉන් සියයට 64 ක් (රු. බිලියන 128 ක්) දිවිනැගුම දෙපාර්තමේන්තුව විසින් ද, සියයට 19 ක් (රු. බිලියන 38 ක්) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ද, සියයට 13 ක් (රු. බිලියන 26 ක්) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ද, සියයට 3 ක් (රු. බිලියන 6 ක්) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ද, ඉතිරි සියයට 1 (රු. බිලියන 3 ක්) ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් ද ලබා දී ඇත.

4 වගුවේ දැක්වෙන පරිදි 2014 වසරේ දී අඩු ආදායම්ලාභී ජනතාවගේ මුළු තැන්පතු ප්‍රමාණය රු. බිලියන 217 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර ඉන් රු. බිලියන 156 ක් ප්‍රධාන ක්ෂුද්‍රමූල්‍ය ආයතන විසින් දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජනයන්හි යොදවා ඇත.



2014 වසරේ දී බලපත්‍රලාභි වාණිජ බැංකු විසින් ක්ෂුද්‍රමූල්‍ය අංශයට ණය වශයෙන් ලබා දී උපයෝජනය කර ඇති මුළු මුදල රු. බිලියන 106 ක් වන අතර ඉන් රු. බිලියන 55 ක් ලංකා බැංකුව විසින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර), දිළිඳු බව තුරන් කිරීමේ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපෘතිය හා "සෞභාග්‍යා" යන ණය යෝජනා ක්‍රම හරහා සුළු පරිමාණ ණය ලෙස ලබා දී ඇත. සණස සංවර්ධන බැංකුව හා මහජන බැංකුව ද 2014 වසර තුළ එය පිළිවෙලින් රු.

බිලියන 31 ක් හා රු. බිලියන 9 ක් ක්ෂුද්‍රමූල්‍ය අංශය සඳහා ප්‍රදානය කරමින් සුවිශේෂ කාර්යභාරයක් වූ කර ඇත. රාජ්‍ය බැංකු හා සන්සන්දනය කරන විට සැලකිය යුතු ප්‍රමාණයේ ක්ෂුද්‍රමූල්‍ය කලඹක් පවත්වාගෙන යන පෞද්ගලික අංශයේ බැංකු වන සෙලාන් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව විසින් ද සැලකිය යුතු ණය ප්‍රමාණයක් විවිධ ක්ෂුද්‍රමූල්‍ය වැඩසටහන් හරහා ග්‍රාමීය අංශයට ලබා දී ඇත.

2.3.1 "ලිය ඉසුර" - කුඩා ව්‍යාපාරවල නියුතු කාන්තා ව්‍යවසායිකාවන් සඳහා ණය යෝජනා ක්‍රමය

ප්‍රමාණවත් ඇප සුරකුම් නොමැති එහෙත් ලාභදායී ව්‍යාපාර හෝ ව්‍යාපාරික යෝජනා සහිත කාන්තා ව්‍යවසායිකාවන් ඉලක්ක කර ගනිමින් "ලිය ඉසුර" විශේෂිත ණය යෝජනා ක්‍රමය 2014 වසරේ මාර්තු මාසයේ දී ආරම්භ කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ කාන්තා ව්‍යවසායිකාවන් සඳහා රු. 250,000/- ක උපරිමයකට යටත්ව දැනට පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාර වැඩි දියුණු කිරීමට හෝ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් මූල්‍යමය පහසුකම් සපයනු ලැබේ.

විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතුවල නියුතු කාන්තා ව්‍යවසායිකාවන් සඳහා ඔවුන්ගේ වයස් සීමාවන් ද නොසලකා පොලිය හා ඇප රහිතව මෙම ණය ප්‍රදානය කරනු ලැබේ. මූල්‍යමය ප්‍රවේශයන් සීමා වීම හේතුවෙන් තමාගේම ව්‍යාපාරක් ආරම්භ කිරීමට නොහැකි වූ හා දැනට පවතින ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමට නොහැකි වූ සැලකිය යුතු කාන්තා ව්‍යවසායිකාවන් ප්‍රමාණයක් 2014 වසර තුළ දී මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ඇත.



2014 වසර තුළ රට පුරා සිටින කාන්තා ව්‍යවසායිකාවන් 13,400 ක් සඳහා රු. මිලියන 3,350 ක් ලබා දීම "ලිය ඉසුර" ණය යෝජනා ක්‍රමයේ අරමුණ විය. ඒ අනුව අපේක්ෂිත අරමුණ ද අභිබවා යමින් 2014 වසර තුළ මෙම ණය යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වූ අතර ඒ යටතේ ප්‍රතිලාභ ලැබූ කාන්තා ව්‍යවසායිකාවන් සංඛ්‍යාව 14,421 ක් හා ප්‍රදානය කළ ණය මුදල රු. මිලියන 2,316 කි. ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සැලකිය යුතු ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇති අතර කාන්තා ව්‍යවසායිකාවන් 3,500 කට වඩා වැඩි ප්‍රමාණයකට එම දිස්ත්‍රික්කය තුන තුළ පමණක් 2014 වසර තුළ ප්‍රතිලාභ හිමි වී ඇත. මෙම ණය පහසුකම් කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා අංශවල නව ව්‍යාපාර ආරම්භ කිරීමට හා පවතින ව්‍යාපාර දියුණු කිරීම සඳහා යොදවා ඇත.

රූප සටහන 4 -''ලිය ඉසුර'' අංශික ප්‍රගතිය - 2014



2014 වසර තුළ ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 60 ක් නිමි ඇඳුම්, කොහු ආශ්‍රිත නිෂ්පාදන හා අත්කම් වැනි කර්මාන්තවල යොදවා ඇති අතර සියයට 21 ක් සුළු වෙළෙඳ ව්‍යාපාරික කටයුතු සඳහා යොදවා ඇත. එයට අමතරව කාන්තා ව්‍යවසායිකාවන්ගෙන් සියයට 13 ක් හා සියයට 6 ක් පිළිවෙලින් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතුවල නිරත වී ඇත. තම පවුලේ සමාජිකයින්ගේ සහාය මත දේශීය කර්මාන්තවල නියලී සිටින බොහෝමයක් කාන්තාවනට තම පවුලේ කටයුතු සිදු කරන අතරතුර තමන්ගේම ව්‍යාපාරයක නියලෙමින් තම පවුලේ වියදමට අමතර ආදායමක් එකතු කර ගැනීමට මෙමඟින් ඉඩ ප්‍රස්ථා සැලසේ.

සටහන 1 - උකස් අත්තිකාරම් සඳහා වු විශේෂ සහන

වර්තමානයේ දැවෙන ප්‍රශ්නයක් බවට පත්ව තිබෙන ඉහළ යන ජීවන වියදම අඩු කර ජනතාවට සහන ලබා දීමේ අරමුණින් වර්තමාන රජය විශේෂ ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවට නංවා ඇත. ජීවන වියදම ඉහළ යාම නිසා පීඩාවට පත් ජනතාව තම දෛනික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා තම දෙමාව්පියන්ගෙන් හා සමීප ඥාතීන්ගෙන් මතක සටහන් ලෙස ලැබුණු ස්වර්ණාභරණ උකස් කර ක්ෂණික ණය ලබා ගැනීමට පෙළඹී තිබුණි. මෙසේ රන් භාණ්ඩ උකස් කර ණය ලබා ගත් බහුතරයක් ජනතාව එම මුදල් තම පරිභෝජන අවශ්‍යතාවන් සඳහා වියදම් කිරීමත් උකස් අත්තිකාරම් සඳහා බැංකු විසින් අය කළ පොලිය ඉහළ මට්ටමක පැවතීමත් නිසා ණය ගිවිසුමට අනුව නියමිත කාල සීමාව තුළ දී එම උකස් ණය පියවීමට බොහෝ පිරිසක් අපොහොසත් විය. එබැවින්, මෙම උකස් ණය පිවීමට අවශ්‍ය මුදල් විවිධ වු අවිධිමත් මාර්ගයන්ගෙන් සපයා ගැනීමට යාම හේතුවෙන් මෙම පීඩිත ජනතාව තව තවත් ණය උගුලේ සිර වී ඇත.

ජනතාව පත්ව ඇති මෙම අවාසනාවන්ත තත්ත්වය තේරුම් ගත් නව රජය ඉහළ යන ජීවන වියදම හේතුවෙන් පීඩාවට පත්ව ඇති ජනතාවට ලබා දෙන විශේෂ සහනයක් ලෙස උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා වු අධික පොලිය 2015 මාර්තු 15 සිට බලපැවැත්වෙන පරිදි කපා හැරීමට ක්‍රියා කරන ලදී.

මෙම සහන වැඩපිළිවෙල අනුව, රු. 200,000/- ක් දක්වා රාජ්‍ය බැංකු හරහා උකස් අත්තිකාරම් ලබා ගත් ජනතාව මෙම පොලී සහනය ලැබීමට සුදුසුකම් ලබයි. මෙම පොලී සහනය ලබා දීම සඳහා රු. මිලියන 7,000 ක මුදලක් 2015 අතුරු අයවැය මඟින් වෙන් කර ඇති අතර, 100,000 කට අධික ජනතාවක් මෙමඟින් ප්‍රතිලාභ ලැබීමට නියමිතය.

2.4 කෘෂිකාර්මික ක්ෂේත්‍රය නඟා සිටුවීම

2.4.1 පොහොර සහනාධාර වැඩසටහන

කෘෂිකාර්මික නිෂ්පාදනවල නිෂ්පාදන පිරිවැය අඩු වීම හා කෘෂි යෙදවුම් සඳහා වන ප්‍රවේශ මාර්ග පුළුල් වීම වැනි හේතු පදනම් කර ගෙන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වර්ධන ඉලක්කයන් ළඟා කර ගැනීම සඳහා පොහොර සහනාධාර වැඩසටහන හරහා ලැබෙන දායකත්වය අතිවිශාලය. දැනට ක්‍රියාත්මක පොහොර සහනාධාර වැඩසටහන 2005 දී ප්‍රකාශයට පත් කරන ලද අතර, පොහොර සඳහා දැරීමට සිදු වී ඇති අධික මිල නිසා ඇති වන දුෂ්කරතාවයන්ගෙන් ගොවි

ජනතාව මුදවා ගැනීම සඳහා මෙම වැඩසටහන ඉවහල් වී ඇත. පසේ සාරවත්භාවය අපේක්ෂිත ආකාරයෙන් පවත්වා ගනිමින් ප්‍රශස්ථ ඵලදාවක් ලබා ගැනීම පිණිස මේ වන විටත් වී වගාව ඇතුළු අනෙකුත් බෝග සඳහා ද පොහොර සහනාධාරය ලබා දෙනු ලැබේ. 2014 වසරේ දී මෙම වැඩසටහන සඳහා රජය විසින් වැය කරන ලද මුළු මුදල රු. මිලියන 31,802 ක් පමණ වේ.



රූප සටහන 5 - පොහොර සහනාධාර වැඩසටහන සඳහා 2005 සිට 2014 දක්වා රජය විසින් දරන ලද වියදම

2.4.1.1 වී වගාව සඳහා වන පොහොර සහනාධාරය

වී වගාව සඳහා අවශ්‍ය ප්‍රධාන යෙදවුමක් ලෙස පොහොර හඳුනාගෙන ඇති බැවින්, 2005 වසරේ සිට වී වගාව සඳහා නිර්දේශිත ප්‍රධාන සෘජු පොහොර වර්ග තුන, කිලෝ ග්‍රෑම් 50 ක පොහොර මිටියක් රු. 350/- ක සහනාධාර මිලකට ලබා දීමට රජය විසින් කටයුතු කර ඇත. ඒ අනුව, යූරියා, ටී.එස්.පී. (ට්‍රිපල් සුපර් පොස්ෆේට්) හා එම්.ඕ.පී. (මියුරියේට් ඔෆ් පොටෑෂ්) යන පොහොර වර්ග රාජ්‍ය පොහොර සමාගම් දෙකෙහි බෙදා හැරීමේ ජාලය මඟින් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා බෙදා දෙනු ලැබේ.

කිලෝ ග්‍රෑම් 50 ක වී පොහොර මිටියක් සඳහා රජය විසින් දරනු ලබන සහනාධාර මුදල දළ වශයෙන් සියයට 88 ක් පමණ වේ.



රූප සටහන 6 - වී වගාව සඳහා වන පොහොර සහනාධාරය - 2014

2014 වර්ෂයේ පැවති නියං කාලගුණික තත්ත්වය වී වගාව කෙරෙහි දැඩි ලෙස බලපෑ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වී නිෂ්පාදනය, වපුරන ලද බිම් ප්‍රමාණය, අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණය හා බෙදා හරින ලද වී පොහොර ප්‍රමාණය 2013 වසරේ කන්න දෙකට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමකින් අඩු වී ඇත.

වගුව 5 - 2013 හා 2014 වර්ෂයන්හි වී වගාව සඳහා සංසන්දනාත්මක දත්ත

විස්තරය	පොහොර ලබා ගත් ගොවීන් සංඛ්‍යාව	බෙදා දුන් පොහොර ප්‍රමාණය (මෙ.ටො.)	දළ වශයෙන් වපුරන ලද බිම් ප්‍රමාණය (හෙක්.)	අස්වනු නෙලා ගත් ශුද්ධ බිම් ප්‍රමාණය (හෙක්.)	වී නිෂ්පාදනය (මෙ.ටො.)
2012/13 මහ	1,044,343	247,078	779,635	664,804	2,846,276
2013 යල	658,560	113,434	447,613	402,534	1,774,452
2013 වසර සඳහා එකතුව	**1,702,903**	**360,512**	**1,227,248**	**1,067,338**	**4,620,728**
2013/14 මහ	941,792	186,846	651,289	520,608	2,235,851
2014 යල	538,048	92,518	312,979	272,339	1,144,929
2014 වසර සඳහා එකතුව	**1,479,840**	**279,364**	**964,268**	**792,947**	**3,380,780**
2013 සිට 2014 දක්වා ප්‍රතිශත අඩු වීම	**13**	**23**	**21**	**26**	**27**

මූලාශ්‍රය : ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.4.1.2 අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය

වී හැර අනෙකුත් බෝග වගාවන්හි ඵලදායිතාවය ඉහළ නැංවීමට මෙන්ම ගොවීන් හට සිය වගා කිරීමේ හැකියාව එක් බෝගයක සිට බහු විධ බෝග වගාව දක්වා ව්‍යාප්ත කිරීමට පිටුවහලක් වන රජයේ පොහොර සහනාධාරය වැඩසටහන යටතේ අනෙකුත් බෝග වගාවන් සඳහා අදාළ වන පහත සඳහන් සහනදායී මිල ගණන් යටතේ රජය විසින් 2014 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

- කිලෝ ග්‍රෑම් 50 ක ඕනෑම වර්ගයක සෘජු පොහොර මිටියක් රු. 1,200/- ක සහනාධාර මිලකට සැපයීම.
- කිලෝ ග්‍රෑම් 50 ක මිශ්‍ර පොහොර මිටියක් රු. 1,300/- ක සහනාධාර මිලකට සැපයීම.

කිලෝ ග්‍රෑම් 50 ක සෘජු පොහොර මිටියක් සඳහා වෙළෙඳපොළ මිලට සාපේක්ෂව රජය විසින් දරනු ලබන සහනාධාර මුදල දළ වශයෙන් සියයට 31 සිට සියයට 77 පමණ පරාසයක පිහිටයි.



රූප සටහන 7 - අනෙකුත් බෝග සඳහා වන පොහොර සහනාධාරය - 2014

මෙම වැඩසටහන මඟින් පොහොර ලබා ගැනීමට ඇති ප්‍රවේශ මාර්ග පුළුල් කර විවිධ වර්ගයේ සෘජු හා මිශ්‍ර පොහොර වර්ග විවිධ ප්‍රමාණයන්ගෙන් යුතුව පෞද්ගලික අංශයේ හා රජයේ පොහොර සමාගම් හරහා මිල දී ගැනීමට පාරිභෝගිකයින් හට ඉඩකඩ සලසා දී ඇත.

2014 වසරේ දී මෙම වැඩසටහන යටතේ වී හැර අනෙකුත් බෝග සඳහා බෙදා දී ඇති පොහොර ප්‍රමාණය මෙ.ටො. 407,439 ක් පමණ වේ.

රූප සටහන 8 - වී හැර අනෙකුත් බෝග සඳහා පොහොර බෙදා දීමේ ප්‍රගතිය - 2014



2.4.2 නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර)

කෘෂිකාර්මික අංශයට ණය පහසුකම් සපයමින්, ග්‍රාමීය අංශයේ නිෂ්පාදනයන් දිරි ගන්වමින් හා එම ජනතාවගේ ජීවන තත්ත්වයන් නඟා සිටුවීමේ අරමුණෙන් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය 2014 වසර තුළදී ද ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොල තුළ පැවති තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අය කළ සහනදායී පොලී අනුපාතයන් 2014 වසරේ දී සංශෝධනය කරන ලදී. ඒ අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ගොවීන් සඳහා ලබා දෙන ණය මුදලේ පොලී අනුපාතය සියයට 9 සිට සියයට 7 දක්වා ද රජය විසින් ගෙවනු ලබන පොලී සහනාධාර අනුපාතය සියයට 6 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී. දේශීය බෝගවලින් ස්වයංපෝෂිත වීමේ රජයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා වගා කිරීමේ පිරිවැය ඉහළ යෑමට සමගාමීව බෝග වර්ග 32 ක් සඳහා ප්‍රදානය කළ උපරිම ණය ප්‍රමාණය ද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කරන ලදී.

වගුව 6 - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය - 2014

බෝගය	උපරිම ණය සීමාව (අක්කරයකට)	උපරිම භූමි ප්‍රමාණය (අක්කරයකට)	ලබා දුන් ණය ප්‍රමාණය	ප්‍රදානය කළ ණය මුදල (රු. මිලියන)	භූමි වපසරිය (අක්කර)
වී - වාරි ජලය	30,000	10	53,343	3,773	183,916
වර්ෂා ජලය	32,000	10			
බඩ ඉරිඟු	34,000	10	8,446	465	20,466
අර්තාපල්	252,000	2	3,907	612	3,975
ලොකු ලූණු	140,000	2	12,518	1448	19,575
වියළි මිරිස්	88,000	2	3,141	177	4,744
එළවළු	31,000 - 119,000	2	2,414	136	3,797
වෙනත්-ඉගුරු	70,000	2	2,374	137	4,447
එකතුව			**86,143**	**6,748**	**240,920**

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණය අනුව, අක්කරයකට රු. 32,000 ක උපරිමයකට යටත්ව සුළු පරිමාණ ණය වැඩි ප්‍රමාණයක් වී වගාව සඳහා ලබා දී ඇති අතර 2014 වසර තුළ ප්‍රදානය කරන

ලද මුළු ණය ප්‍රමාණයෙන් එය සියයට 60 ක් වේ. ලොකු ලූණු හා බඩ ඉරිඟු වගාකරුවන් ද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වැඩි ප්‍රතිලාභ ලබා ගෙන ඇති අතර එම අංශ සඳහා මුදා හරින ලද ණය ප්‍රමාණය පිළිවෙලින් සියයට 14 ක් හා සියයට 10 ක ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. 2014 වසර තුළ මෙම ණය පහසුකම් යටතේ අක්කර 240,921 ක කෘෂි බෝග වගා කර ඇති අතර ඉන් සියයට 76 ක පමණ ස්වයංපෝෂිත මට්ටම කරා ලඟා වීමට සඳහා රජය විශාල වශයෙන් සහන ලබා දෙන වී, වගා කර ඇත.



2014 වසර තුළ ලබා දී ඇති ඉහළම ණය ප්‍රමාණය යාපනය දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය ප්‍රතිලාභීන් 8,627 ක් සඳහා රු. මිලියන 1,256 ක මුදල් ප්‍රමාණයක් වේ. විශේෂයෙන් ණය පහසුකම් සඳහා ප්‍රවේශ වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් වීමත්, එම ප්‍රදේශවල පැවති සාමකාමී වාතාවරණයක් එම ප්‍රදේශවල ඉහළ ණය ඉල්ලුමට හේතු වී ඇත. එමෙන්ම අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව බලන කළ අනුරාධපුරය, හම්බන්තොට හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල ද ප්‍රදානය කළ ණය ප්‍රමාණයේ හා ප්‍රතිලාභීන් සංඛ්‍යාවේ ඉහළ අගයක් පෙන්නුම් කරයි.



බෝග ව්‍යාප්තිය අනුව සලකා බලන විට ද වැඩිම ණය ප්‍රමාණයක් වී වගාව සඳහා ලබා දී ඇති අතර එය 2014 වසර තුළ ප්‍රදානය කළ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 62 ක් පමණ වේ. ආහාර සුරක්ෂිතතාවය හා ආදායම් උත්පාදන අවස්ථා ඇති කිරීම සඳහා ආනයන ආදේශක බෝග ලෙස

ප්‍රවර්ධනය කළ ලොකු ලූණු හා බඩ ඉරිඟු වගාවන් සඳහා ද පිළිවෙලින් වී වගාවට පසුව ඉහළ ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත.

සටහන 2 - වගා ණය සඳහා සහන

කෘෂිකර්මය පදනම් වූ ආර්ථිකයක ගොවියන්ගේ කාර්යභාරය සුවිශේෂිත්වයක් උසුලයි. එසේ වුවත්, පසුගිය කාල පරිච්ඡේදය තුළ ගංවතුර, නියඟ, වසංගත, ස්වාභාවික උපද්‍රව හා සිවිල් ගැටුම් වැනි පාලනය කළ නොහැකි සාධක හේතුවෙන් වගා පාළු වීම නිසා විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට ගොවීන්ට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා බැංකුවලින් ලබා ගත් ණය නැවත ගෙවීමට නොහැකි විය. ගොවීන් මුහුණ දුන් මෙම දුෂ්කරතා අවම කිරීමේ අරමුණෙන් රජයේ බැංකුවලින් ලබා ගත්තා වූ වගා ණයවලින් සියයට 50 ක් කපා හැරීමට 2015 අතුරු අයවැය මඟින් යෝජනා කරන ලදී.

වී ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම සඳහා කිසියම් වගා ණය යෝජනා ක්‍රමයක් යටතේ ලබා ගෙන නියමිත පරිදි නොගෙවීම නිසා අක්‍රීය ගණයට මාරු කර ඇති ණය සඳහා එක් ණයලාභියෙකුට රු. 100,000/- ක උපරිමයකට යටත්ව මෙම වගා ණය කපා හැරීමේ වැඩසටහන යටතේ සහන හිමිවේ. අදාළ බැංකු විසින් අක්‍රීය මට්ටමේ පවතින ණය ශේෂවලින් සියයට 50 ක් කපා හරිනු ලබන අතර ඒ වෙනුවෙන් බැංකුවට සිදු වන පාඩුව මහා භාණ්ඩාගාරය විසින් අදාළ බැංකු වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙම සහනයන් 2015 මාර්තු මස 06 වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 2,500 ක් රජය මඟින් 2015 අතුරු අයවැයෙන් වෙන් කර ඇත.

2.4.3 වගා රක්ෂණය

නියඟ, ගං වතුර හා වන අලින්ගෙන් සිදු වන වගා හානි සඳහා සහන සැලසීමේ අරමුණින් 2013 වර්ෂයේ දී ආරම්භ කළ මෙම වගා රක්ෂණ ක්‍රමය ආරම්භයේ දී ජාතික රක්ෂණ භාර අරමුදල හරහා ක්‍රියාත්මක විය. මෙම රක්ෂණ ක්‍රමයට දායක වී ඇති ගොවීන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණ ඇතිව 2014 වර්ෂය දී මෙම වගා රක්ෂණ වැඩසටහනෙහි කාලීන වෙනස්කම් කිහිපයක්ම සිදු කරන ලදී. ඒ අනුව, වී ගොවීන්ට පමණක් සීමා වූ මෙම වගා රක්ෂණ ක්‍රමයේ ප්‍රතිලාභ අනෙකුත් බෝග වගාවන්හි නිරත කුඩා පරිමාණ ගොවීන්ට ද ලබා දුන් අතර, ගෙවීම් කිරීමේ දී සිදු විය හැකි අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීම පිණිස 2014 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මෙම වගා රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ බලය කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පවරන ලදී. 2014 වර්ෂය තුළ දී රු. මිලියන 795 ක මුදලක් රක්ෂණ වාරික වශයෙන් ලැබී ඇති අතර, වගා හානි සඳහා ගොවීන් 33,387 දෙනෙකු අතර රු. මිලියන 365 ක මුදලක් බෙද දී ඇත.

2.4.4 ගොවීන් සඳහා වූ සමාජ ආරක්ෂණය

2014 අයවැය මඟින් යෝජනා කරන ලද ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය 2014 වර්ෂය පුරා ගොවීන්ට ඉහළ ප්‍රතිලාභ අත් කර දෙමින් ක්‍රියාත්මක විය. 2014 වර්ෂය අවසාන වන විට ගොවීන් 123,768 දෙනෙකු වෙත විශ්‍රාම වැටුප් ලබා දී ඇති අතර, ඒ සඳහා රු. මිලියන 2,130 ක මුදලක් වැය කර ඇත. ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි පවතින අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් නිසි කලට ගොවි විශ්‍රාම වැටුප ලබා දීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් මාසිකව රු. මිලියන 180 ක මුදලක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙයි. මේ වන විට මෙම විශ්‍රාම වැටුප් ක්‍රමයට සුදුසුකම් ලැබූ ගොවීන් සෑම මසකම පළමු සතිය තුළ දී තම පදිංචියට ආසන්නතම තැපැල් කාර්යාලය හරහා තම විශ්‍රාම වැටුප ලබා ගනී.

වගුව 7 - 2014 වර්ෂය තුළ වයස් කාණ්ඩ අනුව ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම.

වයස් කාණ්ඩය	මාසික විශ්‍රාම වැටුප (රු.)	විශ්‍රාම වැටුප් ලබන ගොවීන් සංඛ්‍යාව	ගෙවන ලද මුදල (රු. මිලියන)
60 - 63	1,000	18,832	163
64 - 70	1,250	73,018	1,095
71 - 77	2,000	28,981	696
78 ට ඉහළ	5,000	2,937	176
එකතුව		**123,768**	**2,130**

මූලාශ්‍රය : කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

2.4.5 කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සඳහා වන සහන

රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී වැවිලි කර්මන්ත අංශය නිසි පරිදි දායක කර ගැනීම හා එහි අඛණ්ඩ වර්ධනය සඳහා පියවර ගැනීම ඉතා වැදගත් වනුයේ එම අංශය විදේශ විනිමය ඉපයීම මඟින් ආර්ථික සංර්ධනයට මහඟු දායකත්වයක් සපයන බැවිනි. දශක ගණනාවක් තිස්සේ රටෙහි ආර්ථිකයට දුන් ඉහළ දායකත්වය නිසාම නිදහසින් පසුව බිහි වූ සෑම රජයක්ම වැවිලි කර්මාන්ත අංශයේ නිරතවූවන්ට සහන සැලසීමට කටයුතු කරන ලදී. මෙරට සමස්ත අපනයනයන්ගෙන් සියයට 17.5 කට හා දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.9 කට වැවිලි කර්මාන්ත අංශය දායක වේ.

වර්තමානයේ දී, වැවිලි කර්මාන්ත අංශය කෙරෙහි වැඩි දායකත්වයක් සපයනුයේ කුඩා පරිමාණ වැවිලිකරුවන් වන අතර, අක්කර 10 ට අඩු තේ හා රබර් වතු හිමියන් හා අක්කර 5 ට අඩු පොල් වගාකරුවන් මෙම කුඩා පරිමාණ වැවිලිකරුවන් යටතට ගැනේ. තවද, මෙම කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශය සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 72 කට, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 65 කට හා සමස්ත පොල් නිෂ්පාදනයෙන් සියයට 82 කට ද දායකත්වය සපයයි.

වගුව 8 - කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය, 2010 - 2014

වර්ෂය	තේ		රබර්		පොල්	
	භූමි ප්‍රමාණය (හෙක්.)	සමස්ත නිෂ්පාදනය (කි.ග්‍රෑම් මිලියන)	භූමි ප්‍රමාණය (හෙක්.)	සමස්ත නිෂ්පාදනය (කි.ග්‍රෑම් මිලියන)	භූමි ප්‍රමාණය (හෙක්.)	සමස්ත නිෂ්පාදනය (ගෙඩි මිලියන)
2010	204,619	331	125,645	153	394,836	1,900
2011	206,104	328	128,120	158	394,836	2,303
2012	194,508	328	130,780	152	394,836	2,411
2013	194,508	340	133,668	130	394,836	2,061
2014	194,508	338	140,000	99	394,836	2,890

මූලාශ්‍රය : වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා තේ මණ්ඩලය

මෙම කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත අංශයේ නිරතවූවන් දිරිගැන්වීමේ අරමුණ ඇතිව තේ හා රබර් නැවත වගා කිරීම හා අළුතින් වගා කිරීම සඳහා රජය මඟින් ලබා දෙන සහනාධාර 2014 වර්ෂය තුළ දී තවදුරටත් ඉහළ නංවන ලදී. ඒ අනුව, තේ නැවත වගා කිරීම සඳහා සහ නව වගාවන් සඳහා හෙක්ටයාරයකට පිළිවෙලින් රු. 500,000 හා රු. 400,000 ක සහනාධාරයක් ද, රබර් නැවත වගාවන් හා නව වගාවන් සඳහා හෙක්ටයාරයකට පිළිවෙලින් රු. 175,000 හා රු. 150,000 ක සහනාධාරයක් ද ලබා දෙන ලදී.

සටහන 3 - ස්වාභාවික රබර් සඳහා සහතික මිල ක්‍රමය

කුඩා පරිමාණ රබර් වතු හිමියන් දිරිගැන්වීමේ අරමුණින් 2015 අයවැය යෝජනාවක් අනුව ස්වාභාවික රබර් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 300/- සහතික මිලක් ලබා දීම, 2014 නොවැම්බර් මස 15 වන දින සිට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන ලදී. ආරම්භක අදියරේ දී මෙම සහතික මිල දුම් ගැසූ ෂීට් රබර් (ආර්.එස්.එස්. 1,2,3,4 සහ 5) සඳහා පමණක් ලබා දුන් අතර, පසුව කුඩා පරිමාණ රබර් කිරි නිෂ්පාදකයින් කරන ලද ඉල්ලීම් සලකා බලා මෙම සහනය ඔවුන් වෙත ද ලබා දීමට කටයුතු කරන ලදී.

මෙම කුඩා පරිමාණ රබර් වගාකරුවන් තවදුරටත් දිරිගැන්වීම සහ රබර් කර්මාන්තයේ අනාගත අභිවෘද්ධිය සලකා බලා 2015 අතුරු අයවැය මඟින් මෙම සහතික මිල ස්වාභාවික රබර් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 350/- ක් දක්වා ඉහළ නැංවීමට යෝජනා කරන ලදී. ඒ අනුව, කුඩා පරිමාණ රබර් වැවිලිකරුවන් ඉහළ අගය එකතු කළ වටිනාකමක් සහිත ගුණත්වයෙන් උසස් නිෂ්පාදන සඳහා යොමු කිරීමේ අරමුණින් මෙම නව සහතික මිල ක්‍රමය 2015 අප්‍රේල් 01 වනදා සිට ක්‍රියාත්මක කළ අතර, දේශීය වෙළෙඳපොලේ රබර් සඳහා වන මිල පදනම් කර ගනිමින් කාණ්ඩ හතරක් යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා මෙම සහනාධාරය ඔවුන් වෙත ලබා දෙයි.

වගුව 9 - අදාළ කාණ්ඩය අනුව ලබා දුන් සහතික මිල හා සහනාධාරය

කාණ්ඩය	සහතික මිල (කි.ග්‍රෑම්/රු.)	2015.03.30 දිනට දේශීය වෙළෙඳපොලේ මිල (කි.ග්‍රෑම්/රු.)	ගෙවිය යුතු සහනාධාරය (කි.ග්‍රෑම්/රු.)
RSS 1 සහ RSS 2	350	210	140
RSS 3	325	200	125
RSS 4 සහ RSS 5	300	190	110
Latex	300	195	105

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මෙම සහතික මිල ක්‍රමය ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා රජයට මාසිකව රු. මිලියන 690 ක් පමණ යෙදවීමට සිදු වන අතර, 2015 වර්ෂය සඳහා ඒ වෙනුවෙන් රු. මිලියන 3,600 ක් රජය වෙන් කර ඇත.

සටහන 4 - අමු තේ දළු සඳහා සහතික මිල ක්‍රමය

තේ කර්මාන්තය විදේශ විනිමය උපයන්නකු හා ජීවනෝපාය සපයන්නකු ලෙස යටත් විජිත යුගයේ සිටම මෙරට ආර්ථිකයේ ප්‍රධාන භූමිකාවක් නිරූපනය කරයි. මෑත කාලීනව අමු තේ දළු සඳහා ලබා දෙන මිල සීඝ්‍ර ලෙස පහත වැටීම නිසා තේ කර්මාන්තයේ නියලී සිටින සියයට 72 ක් තරම් වූ කුඩා තේ වතු හිමියන් ඉන් දැඩි පීඩාවට පත් විය. මෙම කරුණු සැලකිල්ලට ගෙන වර්තමාන රජය අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 80/- ක සහතික මිලක් 2015 අප්‍රේල් මස සිට ලබා දීමට යොජනා කරන ලදී.

වර්තමානයේ ක්‍රියාත්මක වන තේ කර්මාන්ත ශාලා 712 කට අමු තේ දළු සපයන 400,000 කට ආසන්න කුඩා තේ වතු හිමියන් මෙම සහතික මිල ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට නියමිත අතර, මෙය ශ්‍රී ලංකා තේ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම යෝජිත ක්‍රමවේදය අනුව, කුඩා තේ වතු හිමියන්ට අමු තේ දළු කිලෝ ග්‍රෑම් එකක් සඳහා ලැබෙන මිල රු. 80/- කට වඩා අඩු නම් කොළඹ තේ වෙන්දේසියේ මිල පදනම් කර ගනිමින් අදාළ මිල වෙනස රජය විසින් ගෙවනු ලැබේ.

මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීමෙන් සමස්ත තේ නිෂ්පාදනය හා වාර්ෂික තේ අපනයන ආදායම පිළිවෙලින් කිලෝ ග්‍රෑම් මිලියන 30 කින් හා රු. බිලියන 9 කින් ඉහළ දැමීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා රජයට මාසිකව රු. මිලියන 700 ක් පමණ වැය කිරීමට සිදු වන අතර, 2015 වර්ෂය සඳහා ඒ වෙනුවෙන් රු. මිලියන 5,000 ක් 2015 අතුරු අයවැය මඟින් වෙන් කර ඇත.

2.5 ආහාර සුරක්ෂිතතාව

2.5.1 වී මිල දී ගැනීමේ වැඩසටහන

පසුගිය වසරවල දී මෙන්ම 2014 වසරේ දී ද රට තුළ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා රජය විසින් විශේෂ කාර්යභාරයක් සිදු කරන ලදී. 2013/14 මහ කන්නයේ දී සහ 2014 යල කන්නයේ දී පැවති නියඟය හේතුවෙන් 2014 වසරේ වී නිෂ්පාදනය සැලකිය යුතු අගයකින් පහළ ගිය අතර එම වසරේ සමස්ත වී නිෂ්පාදනය මෙ.ටො. 3,380,780 ක් විය. එය 2013 වසරේ වී නිෂ්පාදනය හා සැසඳීමේ දී සියයට 27 ක පමණ අඩු වීමකි.



රූප සටහන 11 - මුළු වාර්ෂික වී නිෂ්පාදනය, 2000 - 2014

වගුව 10 - වී අලෙවි මණ්ඩලය විසින් මිල දී ගත් වී ප්‍රමාණය

කන්නය	නාඩු (මෙ.ටො.)	සම්බා (මෙ.ටො.)	මුළු වී ප්‍රමාණය (මෙ.ටො.)	වටිනාකම (රු. මිලියන)
2009/10 මහ	63,850	6,919	70,769	1,995
2010 යල	83,819	27,910	111,729	3,184
එකතුව	**147,669**	**34,829**	**182,498**	**5,179**
2010/11 මහ	2,913	556	3,469	98
2011 යල	58,967	16,205	75,172	2,137
එකතුව	**61,880**	**16,761**	**78,641**	**2,235**
2011/12 මහ	107,319	8,467	115,786	3,259
2012 යල	9,936	540	10,476	294
එකතුව	**117,255**	**9,007**	**126,262**	**3,553**
2012/13 මහ	107,445	31,205	138,650	4,530
2013 යල	81,834	12,542	94,376	3,058
එකතුව	**189,279**	**43,747**	**233,026**	**7,588**
2013/14 මහ	3,971	592	4,563	148
2014 යල	0	0	0	0
එකතුව	**3,971**	**592**	**4,563**	**148**
මුළු එකතුව	**520,054**	**104,936**	**624,990**	**18,703**

මූලාශ්‍රය : වී අලෙවි මණ්ඩලය

මෙලෙස වී නිෂ්පාදනය අඩු වීම නිසා වී මිල දී ගැනීමේ දී පෞද්ගලික අංශයේ වී මෝල් හිමියන් අතර දැඩි තරගකාරීත්වයක් ඇති වීම නිසා ගොවි බිමේදීම ගොවියාට වී සඳහා රජයේ සහතික මිලටත් වඩා ඉහළ මිලක් ලැබිණි. මෙම තත්ත්වය යටතේ, වී අලෙවි මණ්ඩලය මඟින් 2014 වසරේ දී ගොවීන්ගෙන් මිල දී ගනු ලැබුවේ වී මෙ.ටො. 4,563 ක් පමණී.

එසේ වුවද, යාපනය, කිලිනොච්චිය, වව්නියාව, මුලතිව්, මොණරාගල හා මඩකලපුව යන දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ මහා භාණ්ඩාගාරය ලබා දුන් රු. මිලියන 263 ක මුදලක් වැය කර වී මෙ.ටො. 7,586 ක් මිල දී ගන්නා ලදී. 2015 අතුරු අයවැය යෝජනාවට අනුව 2014/15 මහ කන්නයේ දී වී මෙ.ටො. 200,000 ක් මිල දී ගැනීමට සැලසුම් කරන ලද අතර ඒ සඳහා රු. මිලියන 9,900 ක ප්‍රතිපාදන වෙන් කරන ලදී. 2015 අප්‍රේල් මාසය අවසන් වන විට රු. මිලියන 7,500 ක් වැය කරමින් වී මෙ.ටො. 157,158 ක් මිල දී ගන්නා ලදී. තවද, 2015 අතුරු අයවැය මඟින් කීරි සම්බා සහ අනෙකුත් සම්බා වී කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 50/- ක් සහ අනෙකුත් වර්ගයේ වී කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 45/- ක සහතික මිලක් ලබා දී ඇත.

වී අලෙවි මණ්ඩලය හරහා වී මිල දී ගැනීම 2008 වර්ෂයේ දී ආරම්භ විය. මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය බැංකු යන මූලාශ්‍ර දෙක හරහා වී අලෙවි මණ්ඩලයට වී මිල දී ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා දෙන ලදී. 2008.01.01 දින සිට 2014.12.31 දින දක්වා වී මිල දී ගැනීම සඳහා රාජ්‍ය බැංකු සහ මහා භාණ්ඩාගරය හරහා වී අලෙවි මණ්ඩලය වෙත ලබා දී ඇති මුළු මුදල රු. මිලියන 16,947 කි. මෙම මුදලින් 2015.01.31 වන දිනට පියවිය යුතුව ඇති හිඟ මුදල රු. මිලියන 8,432 කි. මෙය වී අලෙවි මණ්ඩලය වෙත ලබා දුන් මුළු මුදල හා සැසඳීමේ දී දළ වශයෙන් සියයට 49 ක ප්‍රතිශතයකි. මෙම අරමුදල් වැය කර 2008.01.01 දින සිට 2014.12.31 දින දක්වා මිල දී ගෙන ඇති මුළු වී තොගය මෙ.ටො. 680,831 ක් වන අතර මේ වන විට වී අලෙවි මණ්ඩලය සතුව එම වී වලින් කිසිදු වී ප්‍රමාණයක් ඉතිරි වී නැත.

වී අලෙවි මණ්ඩලය විසින් රාජ්‍ය බැංකු වන ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත 2013.06.30 දින වන විට පියවිය යුතු හිඟ මුදල වන රු. මිලියන 7,326 ක ප්‍රමාණය ආවරණය වෙනුවෙන් අදාළ රාජ්‍ය බැංකු වෙත භාණ්ඩාගාර ඇපකර ලිපි නිකුත් කරන ලදී. පසුව 2014.03.20 දින වන විට පොලිය ද ඇතුළුව ගෙවිය යුතු රු. මිලියන 6,599 ක මුදල ආවරණය කිරීම සඳහා මෙම භාණ්ඩාගාර ඇපකරවල කාලය 2014.12.31 දක්වා දීර්ඝ කරන ලදී. එසේ වුවද, එම ණයවලින් 2015.01.31 දිනට ගෙවීමට ඇති මුදල රු. මිලියන 6,453 කි.

දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් හරහා වී මිල දී ගැනීම 2006 වර්ෂයේ දී ආරම්භ විය. 2006.01.01 සිට 2014.12.31 දින දක්වා මහා භාණ්ඩාගාරය, දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත වී මිල දී ගැනීම සඳහා නිදහස් කළ මුළු අරමුදල් ප්‍රමාණය රු. මිලියන 4,413 කි. මෙයින් 2015.01.31 දින වන විට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන්ගෙන් අය විය යුතු මුළු මුදල රු. මිලියන 485 කි. මෙය ප්‍රතිශතයක් ලෙස ඔවුන් වෙත ප්‍රදානිත මුදලින් සියයට 11 කි. කෙසේ වුවද, මේ වන විට කිසිදු වී තොගයක් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් සතුව නොමැත.

මහා භාණ්ඩාගාරය විසින් දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් වෙත සහ වී අලෙවි මණ්ඩලය වෙත ප්‍රදානිත අරමුදල්වලින් 2015.01.31 දිනට අයවිය යුතු මුළු මුදල රු. මිලියන 2,540 කි. වී අලෙවි මණ්ඩලය විසින් රාජ්‍ය බැංකු වෙත පියවිය යුතු මුදල රු. මිලියන 6,453 කි. ඒ අනුව රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන යටතේ 2015.01.31 දිනට අයවිය යුතු මුළු මුදල රු. මිලියන 8,993 කි.

වගුව 11 - වී මිල දී ගැනීම සඳහා පෞද්ගලික අංශයට ලබා දුන් ණය - 2014

බැංකුව	2013/14 මහ		2014 යල		එකතුව	
	ණය සංඛ්‍යාව	මුළු ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	මුළු ණය මුදල (රු. මිලියන)	ණය සංඛ්‍යාව	මුළු ණය මුදල (රු. මිලියන)
මහජන බැංකුව	193	1,583	142	1,706	335	3,289
ලංකා බැංකුව	333	9,000	229	6,100	562	15,100
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	80	150	114	109	194	259
රාජ්‍ය බැංකු සඳහා මුළු එකතුව	**606**	**10,733**	**485**	**7,915**	**1,091**	**18,648**
කොමර්ෂල් බැංකුව	53	144	199	875	252	1,019
හැටන් නැෂනල් බැංකුව	221	1,732	161	1,230	382	2,962
සෙලාන් බැංකුව	33	226	80	434	113	660
සම්පත් බැංකුව	130	1,362	194	2,043	324	3,405
ඩී.එෆ්.සී.සී. බැංකුව	13	75	17	207	30	282
ජාතික සංවර්ධන බැංකුව	21	249	0	0	21	249
පෞද්ගලික බැංකු සඳහා මුළු එකතුව	**471**	**3,788**	**651**	**4,789**	**1,122**	**8,577**
මුළු එකතුව	**1,077**	**14,521**	**1,136**	**12,704**	**2,213**	**27,225**

මූලාශ්‍රය : අදාළ බැංකු

වී අස්වැන්න කෙරෙහි නියඟ තත්ත්වය බලපෑ නිසා 2014 වර්ෂය තුළ 2013 වර්ෂයට සාපේක්ෂව වී මිල දී ගැනීමේ සැලකිය යුතු වැඩි වීමක් සිදු වී නොමැත. 2014 වර්ෂය තුළ රාජ්‍ය බැංකු සහ පෞද්ගලික බැංකු විසින් වී මිල දී ගැනීම සඳහා රු. මිලියන 27,225 ක් ලබා දී ඇත. මෙය 2013 වසරේ දී ප්‍රදානිත ණය ප්‍රමාණය වන රු. මිලියන 22,868 ට සාපේක්ෂව සියයට 19 ක වැඩි වීමකි.

2013 වර්ෂයේ දී 1,423 ක් වූ ප්‍රදානිත ණය සංඛ්‍යාව 2014 වර්ෂයේ දී 2,213 ක් දක්වා ඉහළ ගොස් ඇත.

2.5.2 ගොවීන් සඳහා සහතික මිලක් ලබා දීම

ආහාර බෝග නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත වීමේ මූලික අරමුණ ඇතිව වගා කටයුතු සඳහා ගොවීන් උනන්දු කරවීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් රජය විසින් ගෙන ඇත. රජය විසින් දේශීය ගොවි ජනතාවට ප්‍රතිලාභ ලබා දීම සඳහා ක්‍රියාත්මක කරන ලද ආහාර බෝග සඳහා වන සහතික මිල ක්‍රමය, වගා රක්ෂණාවරණය හා ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණයන් කිහිපයකි.

ගොවියාට සහතික මිලක් ලබා දීමේ වැඩසටහන යටතේ අර්තාපල් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 80/- ක ද, ලොකු ලූනු කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 60/- ක ද හා වියළි මිරිස් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 350/- ක ද සහතික මිලක් ලබා දීම සඳහා 2014 වර්ෂයේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. තවද, දේශීය ගොවියාට ඉහළ ලාභයක් අත්කර දීම හා ඵලදායී දේශීය බීජ සුලභ කිරීමේ අරමුණු ඇතිව බීජ අර්තාපල් කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 160/- ක හා ලොකු ලූනු බීජ කිලෝ ග්‍රෑම් එකක් සඳහා රු. 12,000/- ක සහතික මිලක් ලබා දීමට ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. මෙම සහතික මිල ක්‍රමය වඩාත් සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා දේශීය අර්තාපල් හා ලොකු ලූනු ගොවීන්ගේ අස්වැන්න නියම කරන ලද සහතික මිලට බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් හා ලංකා සතොස ආයතනය හරහා රජය විසින් මිල දී ගන්නා ලදී. ඒ අනුව, රු. මිලියන 605 ක් වැය කර බදුල්ල හා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් හා ලංකා සතොස ආයතනය හරහා අර්තාපල් මෙ.ටො. 6,352 ක ප්‍රමාණයක් සහතික මිලට මිල දී ගන්නා ලදී. තවද, රු. මිලියන 464 ක් වැය කර ලොකු ලූනු මෙ.ටො. 5,469 ක් ද ලංකා සතොස ආයතනය හරහා සහතික මිල ක්‍රමය යටතේ මිල දී ගන්නා ලදී.

2.5.3 ගබඩා පහසුකම්

වියළි කලාපයේ ගොවි නිෂ්පාදන සඳහා ඉහළ ප්‍රමිතියෙන් යුතු ගබඩා පහසුකම් සපයා දීම මඟින් වී, බඩ ඉරිඟු හා සෝයා බෝංචි වැනි ඔවුන්ගේ නිෂ්පාදන අස්වනු නෙලන කාල සීමාවේ රැස් කර එය ඇපයට තබා බැංකු හරහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා යොදා ගත හැකි නව යාන්ත්‍රණයක් ලෝක බැංකු ආධාර මත රජය විසින් හඳුන්වා දී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ අනුරාධපුරය, මන්නාරම හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි ගබඩා සංකීර්ණ තුනක් ඉදි කිරීම අරම්භ කර ඇත. ඒ අතුරින් මෙ.ටො. 8,000 ක ධාරිතාවකින් යුතු අනුරාධපුර ගබඩා සංකීර්ණයේ ඉදි කිරීම් කටයුතු දැනටමත් අවසන් කර ඇත.

මෙයට අමතරව, අනුරාධපුරය, මාතලේ, පොළොන්නරුව හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ලොකු ලූනු ගබඩා කිරීම සඳහා ගෘහාශ්‍රිතව ගබඩා ඉදි කිරීමට දැනටමත් ගිවිසුම් 374 ක් අත්සන් කර ඇත. මෙම ලොකු ලූනු ගබඩාවල සමස්ත ධාරිතාව මෙ.ටො. 3,980 ක් පමණ වන අතර, මාතලේ, අනුරාධපුරය, පොළොන්නරුව හා කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි පිළිවෙලින් මෙ.ටො. 1,685, මෙ.ටො. 1,415, මෙ.ටො. 560 හා මෙ.ටො. 320 බැගින් වන ගබඩා පහසුකම් ඉදි කෙරෙනු ඇත. 2014 දෙසැම්බර් මස 31 දින වන විට ගබඩා 220 ක් ඉදි කර උක්ත මුළු ගබඩා ධාරිතාවයෙන් මෙ.ටො. 2,275 ක ගබඩා ධාරිතාවක් සම්පූර්ණ කර ඇත.

2.5.4 සහල් ආනයනය

රට තුළ සහල් හිඟයක් ඇති වීම වැළැක්වීමේ සහ වෙළෙඳපොලෙහි සහල් මිල ස්ථාවරව පවත්වා ගෙන යමින් ජනතාවට දැරිය හැකි මිලකට සහල් ලබා දීමේ අරමුණින් රජය විසින් විදේශ රටවලින් සහල් ආනයනය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතන දිරි ගන්වන ලදී. ඒ අනුව, සහල් ආනයනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් රාජ්‍ය බැංකු හරහා ලබා දීමට පියවර ගන්නා ලදී. තවද, සහල් ආනයනයේ දී කිලෝ ග්‍රෑම් එකක් මත පනවා තිබූ රු. 39/- ක් වූ බදු මුදල 2014.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු. 5/- ක් දක්වා ද 2014.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එය රු. 1/- ක් දක්වා ද අඩු කරන ලදී.

රජයකින් රජයකට ලබා දෙන පදනම මත ශ්‍රී ලංකා රජය, බංගලාදේශ රජයෙන් සහල් මෙ.ටො. 25,000 ක් ආනයනය කිරීමට ගිවිසුම්ගත විය. සහල් ආනයනය කරන ප්‍රධාන රාජ්‍ය ආයතනය

ලෙස ලංකා සතොස ආයතනය හරහා මෙම ගිවිසුම යටතේ සහල් ආනයනය කරන ලදී. 2014 වර්ෂයේ දී මෙරටට ආනයනය කළ මුළු සහල් ප්‍රමාණය මෙ.ටො. 599,718 ක් වූ අතර එයින් මෙ.ටො. 108,897 ක් ලංකා සතොස ආයතනය විසින් ආනයනය කර ඇත.

2.6 නියං සහන

2014 වර්ෂයේ මැද භාගයේ දී ඇති වූ නියං තත්ත්වය හේතුවෙන් දිවයින පුරා ජනතාවට පානීය ජල හිඟය, වගා කටයුතු සඳහා අවශ්‍ය වාරි පහසුකම් නොමැති වීම සහ මේ හේතුවෙන් දෛනික ආදායම් මාර්ග ඇනහිටීම වැනි විවිධාකාර වූ ගැටළුවලට මුහුණ පෑමට සිදු විය. මෙම තත්ත්වය හමුවේ, වී ඇතුළු අනෙකුත් බෝග වගාවන් සඳහා සිදු විය හැකි වගා හානි හා විවිධාකර වූ සාමාජයීය හා ආර්ථිකමය පසුබෑම් සලකා බලා "නියගයෙන් පීඩාවට පත් වූ ජනතාවට සහන සැලසීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා වූ සංවර්ධන වැඩසටහන" මුදල් අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ එම වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. පීඩාවන්ට පත්වූ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා මෙම සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රධාන ව්‍යාපෘති හතරක් ක්‍රියාත්මක වූ අතර, එම ව්‍යාපෘති 2014.07.21 දින සිට මාස තුනක කාලයක් පුරා දිස්ත්‍රික්ක 17 ක් තුළ ක්‍රියාත්මක කරන ලදී.

2.6.1 ජලාශ හා වැව්වල රොන් මඩ ඉවත් කිරීම මඟින් ජල ධාරිතාවය ඉහළ නැංවීම

මෙම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 1,300 ක මුදලක් වැය කර ජලාශ හා වැව් 750 ක පමණ රොන් මඩ ඉවත් කිරීම මඟින් නියගය බලපෑ දිස්ත්‍රික්ක 17 හි වගා කටයුතු සඳහා අවශ්‍ය ජල ධාරිතාවය ඉහළ නැංවීමට පියවර ගන්නා ලදී.

වගුව 12 - ව්‍යාපෘතියේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	රොන් මඩ ඉවත් කළ වැව් සංඛ්‍යාව	ඉවත් කළ රොන් මඩ ප්‍රමාණය (අක්කර අඩි)	වියදම (රු. මිලියන)
අනුරාධපුරය	37	1,182.00	220.00
පොළොන්නරුව	42	204.70	31.09
හම්බන්තොට	85	769.00	56.12
පුත්තලම	27	86.40	14.08
වව්නියාව	16	79.10	36.88
ත්‍රිකුණාමලය	45	10.00	11.85
අම්පාර	17	200.10	-
මහනුවර	4	4,690.00	4.89
කුරුණෑගල	23	61.50	10.52
මන්නාරම	15	55.12	56.84
මුලතිව්	9	18.43	19.30
මඩකලපුව	17	3.55	24.22
මොණරාගල	21	517.00	45.68
යාපනය	52	-	-
එකතුව	**410**	**7,876.90**	**531.47**

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2.6.2 පානීය ජල පහසුකම් සැලසීම.

නියගය නිසා බීමට සුදුසු ජලය සපයා ගැනීමට අපහසු ප්‍රදේශවල ජීවත් වන ජනතාවට අවශ්‍ය පිරිසිදු පානීය ජලය සැපයීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. මෙම කාර්යය සඳහා බවුසර් 97 ක් යොදා ගත් අතර ඒ වෙනුවෙන් වැය කළ මුදල රු. මිලියන 42.4 කි.

වගුව 13 - පානීය ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	කාර්යයයේ ස්වභාවය	වියදම (රු. මිලියන)
අනුරාධපුරය	ජල බවුසර 18 ක් යොදා ගනිමින් පානීය ජලය සැපයීම.	3.14
පොළොන්නරුව	ජල බවුසර 46 ක් යොදා ගනිමින් පානීය ජලය සැපයීම.	23.05
මන්නාරම	ජල සැපයුම් පද්ධති 305 ක් ගොඩ නැංවීම.	2.50
වව්නියාව	නල ළිං ප්‍රතිසංස්කරණය හා ජල සැපයුම	11.27
අම්පාර	ජල බවුසර 3 ක් යොදා ගනිමින් පානීය ජලය සැපයීම.	0.15
මොණරාගල	ජල බවුසර 27 ක් යොදා ගනිමින් පානීය ජලය සැපයීම.	2.29

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2.6.3 කෘෂි ළිං ප්‍රතිසංස්කරණය

වගා කටයුතු සඳහා අවශ්‍ය ජල පහසුකම් කෘෂි ළිං මගින් සපයා ගන්නා ගොවීන්ට අවශ්‍ය ජලය සැපයීම ඉහළ නැංවීමේ අරමුණින් කෘෂි ළිං ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් අනුරාධුපරය, පොළොන්නරුව, මන්නාරම, වව්නියාව හා මාතලේ දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 37.02 ක වියදමක් දරමින් කෘෂි ළිං 675 ක් ප්‍රතිසංස්කරණය කරන ලදී.

වගුව 14 - කෘෂි ළිං ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	ප්‍රතිසංස්කරණය කළ කෘෂි ළිං සංඛ්‍යාව	වියදම (රු. මිලියන)
අනුරාධපුරය	137	2.02
පොළොන්නරුව	7	3.21
මාතලේ	168	6.42
මන්නාරම	96	17.0
මොණරාගල	2	0.41
වව්නියාව	49	1.11
මුලතිව්	216	6.85
එකතුව	**675**	**37.02**

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2.6.4 නියඟයෙන් පීඩාවට පත් ජනතාවගේ ආදායම් තත්තවය නඟා සිටුවීම සඳහා "වැඩ සඳහා මුදල්" ව්‍යාපෘතිය

නියඟයෙන් පීඩාවට පත්වූ ප්‍රදේශයන්හි වාරිමාර්ග පද්ධති/ඇළ මාර්ග හා ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා පවත්වාගෙන යාම සඳහා අදාළ ප්‍රදේශයේම ග්‍රාමීය ජනතාවගේ ශ්‍රමය යොදා ගැනීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලදී. මෙයට සමගාමීව, නියඟය බලපෑ ප්‍රදේශවල පීඩාවට පත් ජනතාවගේ කෙටි කාලීන ආදායම් මාර්ග පුළුල් කිරීම ද මෙමඟින් අපේක්ෂා කරන ලදී. නියඟයෙන් පීඩාවට පත් පවුලකින් එක් සාමාජිකයකු බැගින් මේ සඳහා දායක කර ගත් අතර, එක් පුද්ගලයෙකුට මසකට රු. 6,000 ක උපරිමයක් දක්වා ගෙවීම් සිදු කරන ලදී.

වගුව 15 - "වැඩ සඳහා මුදල්" ව්‍යාපෘතියේ ප්‍රගතිය

දිස්ත්‍රික්කය	ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වියදම (රු. මිලියන)
අනුරාධපුරය	129	68,770	48.96
පොළොන්නරුව	325	77,084	45.42
පුත්තලම	40	3,411	4.79
කුරුණෑගල	-	-	18.39

මුලතිව්	270	4,994	29.15
හම්බන්තොට	346	60,937	186.89
වව්නියාව	109	3,455	14.62
ත්‍රිකුණාමලය	31	5,100	6.20
අම්පාර	298	14,558	24.00
මොණරාගල	118	5,012	15.34
මඩකලපුව	13	2,720	8.60
එකතුව	**1,679**	**246,041**	**402.36**

මූලාශ්‍රය : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

2.6.5 බිත්තර වී ලබා දීමේ වැඩසටහන

2014 වර්ෂයේ පැවති නියං තත්ත්වය බොහෝ දිස්ත්‍රික්කවල ගොවීන්ට අහිතකර ලෙස බලපෑ බැවින් 2014/15 මහ කන්නයේ කුඩා පරිමාණයේ ගොවීන්ට වගා කටයුතු සඳහා අවශ්‍ය බිත්තර වී නොමිලේ ලබා දීමට 2015 අයවැය මඟින් යෝජනා කරන ලදී. එම අයවැය යෝජනාව 2014 වර්ෂයේ අගභාගයේ සිටම ක්‍රියාත්මක කරමින් අක්කර 1,136,438 ක වී වගා කිරීම සඳහා අවශ්‍ය බිත්තර වී ලබා දීම රු. මිලියන 2,985 ක් නියඟයෙන් හානියට පත් දිස්ත්‍රික්ක 18 ක පොහොර සහනාධාර ලබන සියළුම ගොවීන් අතර බෙදා දෙන ලදී. මෙම සහන වැඩපිළිවෙල යටතේ ගොවීන් 609,145 ක් පමණ ප්‍රතිලාභ ලබා ගන්නා ලදී.

වගුව 16 - නොමිලයේ බිත්තර වී ලබා දීමේ වැඩසටහන

දිස්ත්‍රික්කය	වියදම (රු.)	වගා කරන ලද භූමි ප්‍රමාණය (අක්කර)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
කුරුණෑගල	550,086,714.00	196,682.00	155,160
පොළොන්නරුව	456,192,490.00	164,751.04	63,377
අම්පාර	297,795,800.00	106,355.65	50,870
අනුරාධපුරය	255,941,660.00	91,408.00	49,773
ත්‍රිකුණාමලය	254,808,812.00	91,003.14	39,312
කිලිනොච්චිය	50,000,000.00	67,984.50	32,245
හම්බන්තොට	181,394,227.25	67,574.33	33,354
මඩකලපුව	143,240,420.00	57,772.35	22,454
වව්නියාව	140,161,000.00	51,172.25	16,533
මන්නාරම	120,423,500.00	43,008.60	14,622
පුත්තලම	112,448,514.50	40,160.14	21,944
මොණරාගල	96,649,800.00	34,830.22	22,560
මාතලේ	73,205,316.68	26,144.76	28,518
මුලතිව්	70,405,300.00	32,329.25	10,424
මහනුවර	65,115,084.50	23,457.22	23,651
යාපනය	62,663,916.57	22,379.97	15,175
බදුල්ල	49,965,100.00	17,844.67	7,999
රත්නපුරය	4,440,887.50	1,580.00	1,174
එකතුව	**2,984,938,543.00**	**1,136,438.07**	**609,145**

මූලාශ්‍රය : සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල

2.7 විශේෂ ණය යෝජනා ක්‍රම

2.7.1 සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා වන ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

සමාජගත කළ පුනරුත්ථාපන අභ්‍යාසලාභීන්ට යහපත් පුරවැසියන් ලෙස ජීවත් වීමට අවශ්‍ය සමාජ වටපිටාව සකස් කිරීම සඳහා ඔවුන්ගේ ආදායම් උත්පාදන මාර්ග හා ජීවන තත්ත්වය නගා

සිටු වීමේ අරමුණු ඇතිව 2012 පෙබරවාරි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පුනරුත්ථාපන අභ්‍යාසලාභී ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය 2012 ජුනි මාසයේ ආරම්භ කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලැබූ අභ්‍යාසලාභීන් සඳහා කෘෂි හා සත්ත්ව පාලන කටයුතු සඳහා උපකරණ මිලට ගැනීම, කෘෂි ව්‍යාප්ත සේවාවන්, සත්ත්ව පාලනය, යන්ත්‍රෝපකරණ මිලට ගැනීම, ගෘහාශ්‍රිත කර්මාන්ත, ධීවර කටයුතු, සුළු ව්‍යාපාර හා ප්‍රාථමික, ද්විතික හා වෘත්තිය අධ්‍යාපනික කටයුතු වැනි විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය ණය රු. 250,000/- ක උපරිමයකට යටත්ව ලබා දේ.

මෙම ණය යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය, පුද්ගලයින්, දේපල හා තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය හා ප්‍රධාන රාජ්‍ය බැංකු (ලංකා බැංකුව, මහජන බැංකුව හා ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව) අතර ත්‍රිපාර්ශවික ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව පළමු අදියර යටතේ ඉලක්කගත ප්‍රතිලාභීන් සඳහා ණය පහසුකම් සැපයීමට රු. මිලියන 300 ක් වෙන් කර ඇත. මෙම ණය යෝජනා ක්‍රමයට අදාළ පොලී අනුපාතය වාර්ෂිකව සියයට 12 ක් වන අතර එයින් සියයට 4 ක් ණය හිමියාගෙන් අයකර ගනු ලබන අතර ඉතිරි සියයට 8 රජය මඟින් පොලී සහනාධාර ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙනු ලැබේ. ණය ආපසු අයකර ගැනීමේ කාලය වසරක සහන කාලයක් ද ඇතුළත්ව වසර 10 ක් වේ. මෙම ණය වැඩසටහනේ අදියර 1 හි ප්‍රගතිය 2015.02.28 දිනට වගු අංක 17 හි දැක්වේ.

ආරම්භයේ දී පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත තේරීම් කමිටුවක් විසින් ණය ලබා දීමට සුදුස්සන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

1. ප්‍රාදේශීය ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙක්
2. බැංකු කළමනාකරු/ බැංකු නිලධාරියෙක්
3. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලයේ නිලධාරියෙක්
4. පුනරුත්ථාපන අධිකාරියේ නිලධාරියෙක්

වගුව 17 - පුනරුත්ථාපන අභ්‍යාසලාභීන් සඳහා ලබා දුන් ණය 2015.02.28 දිනට

දිස්ත්‍රික්කය	ලබා දුන් ණය ප්‍රමාණය	ලබා දුන් ණය මුදල (රු.)	ගෙවන ලද සහනාධාර ප්‍රමාණය (රු.) 2014.06.31 දිනට
යාපනය	288	48,336,000	5,649,096
කිලිනොච්චිය	342	51,984,000	5,624,980
මුලතිව්	430	78,310,000	6,756,977
වව්නියාව	307	47,075,000	5,410,252
මන්නාරම	270	48,700,000	6,047,028
මඩකලපුව	74	11,075,000	513,610
ත්‍රිකුණාමලය	72	14,250,000	778,906
අම්පාර	10	1,650,000	139,752
අනෙකුත් දිස්ත්‍රික්ක	05	1,150,000	59,403
එකතුව	**1,798**	**302,530,000**	**30,980,004**

මූලාශ්‍රය : පුනරුත්ථාපන අධිකාරිය

දිස්ත්‍රික්ක අනුව ණය ලබා දීමේ ප්‍රගතිය සලකා බලන විට 2015 වන විට උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රතිලාභීන් 1,793 දෙනෙකු මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගෙන ඇත. වැඩිම ණය ප්‍රමාණයක් මුලතිව් දිස්ත්‍රික්කයට ලබා දී ඇති අතර එයින් අභ්‍යාසලාභීන් 430 දෙනෙකු ප්‍රතිලාභ ලබා ඇත. 2014 ජුනි මස වන විට රජය විසින් පොලී සහනාධාර වශයෙන් රු. මිලියන 31 ක් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගෙවා ඇත. එමෙන්ම මෙම වැඩසටහනේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා 2014.01.23 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ යටතේ සමාජගත කළ අභ්‍යාසලාභීන් 4,720 දෙනෙකු සඳහා ණය ලබා දීමට බලාපොරොත්තු වේ.

2.7.2 ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, කලාකරුවන් හා ලේඛකයන් සඳහා වූ විශේෂිත මෝටර් රථ ණය යෝජනා ක්‍රමය

වසර 25 ක අඛණ්ඩ සේවා කාලයක් ඇති ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, කලාකරුවන් හා ලේඛකයන් සඳහා විශේෂිත ණය යෝජනා ක්‍රමයක් 2012 අයවැය යෝජනාවලට අනුව ආරම්භ කරන ලදී.

මෙම ණය යෝජනා ක්‍රමය, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වු අතර ඒ යටතේ වාහනයක් මිල දී ගැනීම සඳහා රු. මිලියන 1.2 ක උපරිමයකට යටත්ව පොලී රහිත ණය මුදලක් වසර 07 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලද සහභාගීත්ව මූල්‍ය ආයතන වන ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව මෙම වැඩසටහන යටතේ ලබා දුන් ණය සඳහා අදාළ මුළු පොලී මුදල සියයට 12 සිට 14 දක්වා අනුපාතයක් යටතේ පොලී සහනාධාරයක් ලෙස සම්පූර්ණයෙන්ම රජය විසින් අදාළ බැංකු වෙත ප්‍රතිපූර්ණය කරන ලදී. 2012 හා 2013 අයවැය ප්‍රකාරව මෙම ණය යෝජනා ක්‍රමයේ ඉලක්කගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිවෙලින් 150 ක් හා 1,000 ක් වේ. මෙම වැඩසටහනේ 2014.12.31 දිනට ප්‍රගතිය පහත දැක්වේ.

වගුව 18 - 2014.12.31 දිනට ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන්, කලාකරුවන් හා ලේඛකයන් සඳහා වු ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය

ආයතනය	ලබා දුන් ණය ප්‍රමාණය	ලබා දුන් මුදල (රු. මිලියන)	ගෙවන ලද පොලී සහනාධාරය (රු. මිලියන)
ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය	500	573.2	30.4
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය	615	710.60	54.9
එකතුව	**1,115**	**1283.80**	**85.3**

මූලාශ්‍රය : ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය හා සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් ණය ලබා දීම සඳහා අයඳුම්කරුවන් නිර්දේශ කරමින් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව 2014 අවසාන වන විට ප්‍රතිලාභීන් 1,115 දෙනෙකු සඳහා රු. මිලියන 1,284 ක ණය පහසුකම් ප්‍රදානය කර ඇත. මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 85.3 ක් පොලී සහනාධාර ගෙවීම සඳහා එම කාල පරිච්ඡේදය තුළ වැය කර ඇත.

සටහන 5 - ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ පොලී අනුපාත

තම තරුණ අවධියේ දී රටෙහි සංවර්ධනයට ඉහළ දායකත්වයක් සපයා දැනට විශ්‍රාම සුවයෙන් පසුවන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මූල්‍යමය අතින් ශක්තිමත් හා සුරක්ෂිත දිවියක් ලගා කර දීමේ අරමුණ ඇතිව වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාතයක් ලබා දීමට රජය තීරණය කරන ලදී. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සියයට 12 ක විශේෂ පොලී අනුපාතයක් ලබා දීමට පසුගිය රජය විසින් 2015 අයවැය මඟින් යෝජනා කරන ලදී. මෙම යෝජනාව ක්‍රියාවට නැංවීම තුළින් 500,000 ක පමණ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පිරිසකට ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, 2015 අතුරු අයවැය මඟින් මෙම විශේෂ පොලී අනුපාතය සියයට 15 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ හෝ විශේෂිත බැංකුවක තම සමස්ත තැන්පතු වටිනාකම රු. මිලියන 1 ක් හෝ ඊට අඩු වන ලෙස තැන්පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් මෙම සියයට 15 ක් වන විශේෂ වාර්ෂික පොලී අනුපාතය ලැබීමට සුදුසුකම් ලබයි. එමෙන්ම, මෙම යෝජනාව ක්‍රියාවට නැංවීමේ දී අදාළ බැංකුවලට තම සාමාන්‍ය පොලී අනුපාතයට අමතරව දැරීමට සිදු වන අතිරේක පොලිය සඳහා වන පිරිවැය භාණ්ඩාගාරය විසින් එම බැංකු වෙත ප්‍රතිපූර්ණය කරනු ලබයි. මෙම යෝජනා ක්‍රම ක්‍රියාවට නැංවීම සඳහා 2015 වර්ෂය වෙනුවෙන් රජය රු. මිලියන 4,000 ක් වෙන් කර ඇත.

# 3.	ආයතනික හා පරිපාලන කටයුතු

## 3.1	කාර්යය මණ්ඩලය

තනතුර		අනුමත කාර්යය මණ්ඩලය	මෙහෙයුම් කාර්යය මණ්ඩලය
01	අධ්‍යක්ෂ ජනරාල්	01	01
02	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	00
03	අධ්‍යක්ෂ	04	04
03	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ	04	03
04	නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - ගණකාධිකාරි	01	01
05	සැලසුම් සහකාර	01	01
06	පර්යේෂණ සහකාර	02	01
07	තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර	01	01
08	කළමනාකරණ සහකාර	06	05
09	රියදුරු	06	06
10	කා.කා.ස.	04	04
එකතුව		***31***	***27***

3.2 කාර්යය මණ්ඩල තොරතුරු

නම	තනතුර	සම්බන්ධ කළ හැකි තොරතුරු		
		දුරකථන	ෆැක්ස්	විද්‍යුත් තැපැල
ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා	අධ්‍යක්ෂ ජනරාල්	2484542	2394908	dgdf@dfd.treasury.gov.lk ataÉttu@dfd.treasury.gov.lk
සී.එස්. පෙරේරා මෙය (2014.05.05 ස්ථාන මාරු වී ගොස් ඇත.)	අධ්‍යක්ෂ	2484572	2484955	christinep@dfd.treasury.gov.lk
ඒ.එච්.එස්. ෆරීඩා මෙය (2014.05.05 ස්ථාන මාරු වී ගොස් ඇත.)	අධ්‍යක්ෂ	2484595	2484955	fareedah@dfd.treasury.gov.lk
එම්.කේ.ඩී.එන්. මාදම්පෙ මිය	අධ්‍යක්ෂ	2484605	2484955	nilukad@dfd.treasury.gov.lk
පී.එම්.කේ. හෙට්ටිආරච්චි මහතා	අධ්‍යක්ෂ	2484572	2484955	manjulap@dfd.treasury.gov.lk
ඕ.එම්. ජාබීර් මයා (2014.01.08 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	අධ්‍යක්ෂ	2484507	2484955	mjabeer@dfd.treasury.gov.lk
එච්.එස්.වී. කුමාර මයා (2014.05.05 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	අධ්‍යක්ෂ	2484595	2484955	hemanthak@dfd.treasury.gov.lk
ඩබ්ලිව්.එල්.එම්.ඒ. ලියනගේ මිය	ගණකාධිකාරි	2484596	2484955	liyanagem@dfd.treasury.gov.lk manorigl@yahoo.com
ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය	සහකාර අධ්‍යක්ෂ	2484596	2484955	ranithad@dfd.treasury.gov.lk radranitha@gmail.com
ජේ.ඩී. කොටින්කඩුව මෙය	සහකාර අධ්‍යක්ෂ	2484854	2484955	dilrukshij@dfd.treasury.gov.lk jdilkotinkaduwa@yahoo.com
දිලුමි ඩබ්. කුමාරගුරු මෙය	සහකාර අධ්‍යක්ෂ	2484501	2484955	dilumiw@dfd.treasury.gov.lk
එච්.පී.එස්. ශාන්ත මහතා	සැලසුම් සහකාර	2484884	2484955	shantha@dfd.treasury.gov.lk
ඒ.එම්. වික්‍රමසිංහ මෙය	පර්යේෂණ සහකාර	2484884	2484955	amanthiw@dfd.treasury.gov.lk
පී.එච්.එස්. සමරවික්‍රම මිය	කළමනාකරණ සහකාර	2484862	2484955	-
ටී. හේවාවසම් මිය	කළමනාකරණ සහකාර	2484862	2484955	-
එච්.ඒ.ඩී.ඒ. නිලන්ති මිය	කළමනාකරණ සහකාර	2484855	2484955	-
ආර්.කේ. ලෙනෝරා මයා (2014.01.03 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කළමනාකරණ සහකාර	2484855	2484955	-

නම	තනතුර	සම්බන්ධ කළ හැකි තොරතුරු		
		දුරකථන	ෆැක්ස්	විද්‍යුත් තැපැල
එස්.එස්.එච්.එම්.ඩබ්.කේ. සෙනෙවිරත්න මයා (2014.11.26 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කළමනාකරණ සහකාර	2484855	2484955	-
ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය	තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර	2484884	2484955	-
එම්.එන්.එල්. ප්‍රේමතිලක මයා	රියදුරු	2484855	2484955	-
එච්.පී.ආර්. සමරසිංහ මයා (2014.05.05 ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
කේ.ජී.ඒ. කුමාරසිරි මයා	රියදුරු	2484855	2484955	-
කේ.ඩී. කීර්තිරත්න මයා (2014.06.17 ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
එස්.ඒ. කීර්තිසේන මයා (2014.05.05 ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
ආර්.පී.ජේ. හැන්ටන් මයා (2014.07.11ස්ථාන මාරු වී ගොස් ඇත.)	රියදුරු	2484855	2484955	-
කේ.ඩී.ඩී. ගුණසේකර මයා (2014.07.24 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-
එම්.පී. ගුණවර්ධන මයා (2014.06.13 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-
පී.එච්.සී.එස්. ද සිල්වා මයා (2014.08.13 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	රියදුරු	2484855	2484955	-
එච්.සී.කේ. ජයසිංහ මිය (2014.01.03 ස්ථාන මාරු වී ගොස් ඇත.)	කාර්යාල කාර්ය සහායක	2484855	2484955	-
ආර්.එම්. කුලතුංග මයා	කාර්යාල කාර්ය සහායක	2484855	2484955	-
කේ.පී.අයි. චමින්ද මයා	කාර්යාල කාර්ය සහායක	2484855	2484955	-
ජේ.එම්.ඩී.ජේ.එස්. හේමන්ත මයා	කාර්යාල කාර්ය සහායක	2484855	2484955	-
එම්.ආර්. ජයසිංහ මයා (2014.01.29 දින ස්ථාන මාරු වී පැමිණ ඇත.)	කාර්යාල කාර්ය සහායක	2484855	2484955	-

3.3 දේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

නිලධාරියාගේ නම	පාඨමාලාවෙහි නම	පාඨමාලා කාලය	පැවැත්වූ ආයතනයෙහි නම
ටී. හේවාවසම් මිය කළමනාකරණ සහකාර	රාජ්‍ය කළමනාකාර සහකාරවරුන්ගේ කාර්යයන් හා වගකීම් පිළිබඳ වැඩසටහන	2014.07.24 (එක් දින)	නිපුණතා සංවර්ධන අරමුදල
	ඉ-රාජ්‍ය හා මූලික තොරතුරු තාක්ෂණ කළමනාකරණ පුහුණු වැඩමුළුව	2014.09.24- 2014.09.25	නිපුණතා සංවර්ධන අරමුදල
ආර්.කේ. ලෙනෝරා මයා කළමනාකරණ සහකාර	රාජ්‍ය කළමනාකාර සහකාරවරුන්ගේ කාර්යයන් හා වගකීම් පිළිබඳ වැඩසටහන	2014.07.24 (එක් දින)	නිපුණතා සංවර්ධන අරමුදල
	ගබඩා කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර වැඩසටහන	2014.08.29- 2014.11.07	ඉදි කිරීම් උපකරණ පිළිබඳ පුහුණු ආයතනය

3.4 විදේශීය පුහුණු පාඨමාලා, අධ්‍යයන චාරිකා හා සම්මන්ත්‍රණ

නිලධාරියාගේ නම	පාඨමාලාවෙහි නම	පාඨමාලා කාලය	පැවැත්වූ රටෙහි නම
ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මයා අධ්‍යක්ෂ ජනරාල්	සාර්ක් සංවර්ධන අරමුදලේ 18 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	2014.04.28-2014.04.30	බංගලාදේශය
	සාර්ක් සංවර්ධන අරමුදලේ 19 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම	2014.08.06-2014.08.08	පකිස්ථානය
ඕ.එම්. ජාබීර් මයා අධ්‍යක්ෂ	ආර්ථික විද්‍යාත්මක දර්ශනය පදනම් වූ බිම් මට්ටමේ ආර්ථික සංවර්ධනය	2014.10.20-2014.11.21	තායිලන්තය
එස්.එච්.වී. කුමාර මයා අධ්‍යක්ෂ	ආසියාවේ සහල්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ වැඩමුළුව	2014.09.16-2014.09.19	බංගලාදේශය
ඩබ්.එල්.එම්.ඒ. ලියනගේ මිය ගණකාධිකාරී	සුළු හා මධ්‍ය පරිමාණ මූල්‍යකරණය	2014.09.18-2014.09.19	මැලේසියාව
	රාජ්‍ය සේවා ගිණුම්කරණය	2014.09.29-2014.09.30	ඉන්දුනීසියාව
ආර්.ඒ.ඩී.ආර්. රණසිංහ මෙය සහකාර අධ්‍යක්ෂ	ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධිය	2013.01.14-2014.08.17	ඕස්ට්‍රේලියාව
ජේ.ඩී. කොටින්කඩුව මෙය සහකාර අධ්‍යක්ෂ	2013 දැනුම් හුවමාරු වැඩසටහන, අතුරු වාර්තා වැඩමුළුව	2014.01.20-2014.01.25	කොරියාව
	ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්ති	2014.08.17-2014.08.30	කොරියාව
දිලුමි ඩබ්. කුමාරගුරු මෙය සහකාර අධ්‍යක්ෂ	සුළු හා මධ්‍ය පරිමාණ මූල්‍යකරණය	2014.09.18-2014.09.19	මැලේසියාව
	සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල ප්‍රාදේශීය දර්ශක, ඉන්දියාවේ සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ තරඟකාරීත්වය, අලෙවිකරණය සහ සහයෝගය	2014.11.24-2014.12.05	ඉන්දියාව
එච්.පී.එස්. ශාන්ත මහතා සැලසුම් සහකාර	ව්‍යාපාරික දත්ත රැස් කිරීම, සාරාංශ කිරීම හා විශ්ලේෂණය	2014.06.25-2014.07.22	චීනය
ජේ.එම්.අයි.ඒ. ගීෂානි මෙය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන සහකාර	රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණය	2014.08.14-2014.09.05	මැලේසියාව

4. මූල්‍ය තොරතුරු

වැය විෂය	ඇස්තමේන්තුව (රු.)	සත්‍ය වියදම (රු.)
පුනරාවර්තන වියදම්	**575,889,680.00**	**463,357,390.95**
පුද්ගල පඩි නඩි	13,755,000.00	13,516,952.00
ගමන් වියදම්	1,647,000.00	1,574,093.00
සැපයීම්	2,221,100.00	2,218,708.10
නඩත්තු වියදම්	1,613,000.00	1,585,673.08
සේවා	1,844,680.00	1,679,837.00
සංවර්ධන සහනාධාර (පොළී සහනාධාර)	553,000,000.00	441,553,084.23
වෙනත් මාරු කිරීම්	1,808,900.00	1,229,043.54
මූලධන වියදම්	**7,388,161,020.00**	**6,841,134,709.00**
මුලධන වත්කම් අත්පත් කර ගැනීම.	240,000.00	0.00
හැකියා වර්ධනය	805,320.00	805,307.00
වෙනත් ප්‍රාග්ධන වියදම්	5,239,725,700.00	4,992,464,075.00
සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නගා සිටුවීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය/ජර්මන් රජය)	1,612,000,000.00	1,355,309,974.00
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වැඩි දියුණු කිරීම (ශ්‍රී ලංකා රජය/ජර්මන් රජය)	272,134,650.00	271,691,422.00
ගෝලීය ආහාර අර්බුදයට ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජය/ජර්මන් රජය)	263,255,350.00	220,863,931.00
මුළු එකතුව	**7,964,050,700.00**	**7,304,492,099.95**